# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මගින් මනිනු ලබන සාමාන්‍ය මිල මට්ටම, 2016 වසරේ දී මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් දැක්වීය. සාමාන්‍ය මිල මට්ටමෙහි විචලනය ආහාර කාණ්ඩයෙහි මිල විචලනවලට බොහෝ සෙයින් අනුරූප විය. වසරේ අවස්ථා කිහිපයක දී රජය විසින් හඳුන්වාදුන් බදු සංශෝධන ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන සිදු වූ ආහාර නොවන කාණ්ඩයෙහි මිල ප්‍රවණතාද සාමාන්‍ය මිල මට්ටමෙහි විචලන සඳහා හේතු විය. තවද, 2015 වසර තුළදී පැවති පහළ මිල වාතාවරණයට සාපේක්ෂව ජාත්‍යන්තර වෙළඳපොළ මිල ගණන් ඉහළ යෑම සහ දේශීය මුදල අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනය කරන ලද පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, සාමාන්‍ය මිල මට්ටම මත යම් පීඩනයක් ඇති කළේය. මේ අතර, ආර්ථිකයෙහි ඉල්ලුම් පීඩනය හඟවමින්, කාල පරිච්ඡේදය තුළ දී මූලික ජා.පා.මි.ද. සහ මූලික කො.පා.මි.ද. මගින් මනිනු ලබන යටිදැරි මිල විචලනයද ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී. මෙම ඉහළ යෑම කෙරෙහි රජය විසින් හඳුන්වාදුන් බදු සංශෝධනද හේතු විය. සමස්තයක් වශයෙන් කාල පරිච්ඡේදය තුළ දී සාමාන්‍ය මිල මට්ටමෙහි සහ යටිදැරි උද්ධමනයෙහි ඉහළ යන නැඹුරුව නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.) මගින් ද දැකගත හැකි විය. මේ අතර, ආර්ථිකයෙහි සියලුම අංශවල නාමික වැටුප් ඉහළ ගියද, රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශවල මූර්ත වැටුප්වල පහළ යෑමක් දක්නට ලැබිණි. සේවා නියුක්තිය සලකා බලන විට, 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී ආර්ථිකයේ සේවා නියුක්ති අවස්ථාවල සිදු වූ වර්ධනය පිළිබිඹු කරමින් සමස්ත සේවා වියුක්ති අනුපාතිකය පහළ ගියේය. තරුණයන්, කාන්තාවන් සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන් අතර සේවා වියුක්තිය තවදුරටත් ඉහළ මට්ටමක පැවතිණි. විදේශ රැකියා සඳහා පිටත්වූ පුද්ගලයන් සංඛ්‍යාව මගින් පිළිබිඹු වන විදේශ සේවා නියුක්ති අවස්ථා 2016 වසරේ දී පහළ ගියේය.

## 4.2 මිල

### මිල විචලන සහ ඒ සඳහා දායක වූ සාධක

#### ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.)

**සමස්ත දිවයිනම ආවරණය කෙරෙන, ජා.පා.මි.ද. (2013=100) හි විචලනය මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2016 වසර තුළ දී මිශ්‍ර විචලන සහිතව, සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** ජා.පා.මි.ද. 2016 ජනවාරි මාසයේ දී දර්ශක අංක 112.0 ක් වූ අතර, එය දෙසැම්බර් මස වන විට දර්ශක අංක 118.0 දක්වා ඉහළ ගියේය. 2016 ජනවාරි සිට මාර්තු මස දක්වා ජා.පා.මි.ද. පහළ ගිය අතර, එය 2016 අප්‍රේල් සිට ජූනි මස දක්වා ඉහළ ගියේය. කෙසේ වුවත්, 2016 ජූලි සහ අගෝස්තු මාසවල දී ජා.පා.මි.ද. පහළ ගිය අතර ඉන් අනතුරුව එම ප්‍රවණතාව වෙනස් කරමින් ක්‍රමයෙන් ඉහළ ගියේය. ජා.පා.මි. දර්ශකයෙහි විචලනය බොහෝ සෙයින් ආහාර කාණ්ඩයේ විචලනය අනුව සිදු විය. එසේම ප්‍රධාන වශයෙන් රජයේ බදු සංශෝධන හඳුන්වාදීම, අත්හිටුවීම සහ නැවත හඳුන්වා දීමට අනුකූලව සිදු වූ ආහාර නොවන කාණ්ඩයෙහි විචලන අනුව, ජා.පා.මි.ද. මිශ්‍ර ප්‍රවණතා දැක්වීය.

**4.1 සංඛ්‍යා සටහන**
**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකය (වසර අග) | | වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 (අ) | 2015 දෙසැ/ 2014 දෙසැ | 2016 දෙසැ/ 2015 දෙසැ (අ) | 2015/2014 | 2016/2015 (අ) |
| ජා.පා.මි.ද. (2013=100) | 113.2 | 118.0 | 4.2 | 4.2 | 3.8 | 4.0 |
| කො.පා.මි.ද. (2013=100) | 109.8 | 114.7 | 4.6 | 4.5 | 2.2 | 4.0 |
| කො.පා.මි.ද. (2006/07=100) | 185.2 | 192.8 | 2.8 | 4.1 | 0.9 | 3.7 |
| නි.මි.ද. (2013-4 වැනි කාර්තුව=100) | 107.2 (ආ) | 115.5 | 5.0 (ආ) | 7.7 | 3.6 (ආ) | 1.7 |
| ද.දේ.නි. අවධමනකය (2010=100) | 126.8 (ආ) | 131.4 | - | - | 0.8 (ආ) | 3.6 |


(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4

ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2016 වසරේ දී සමස්තයක් වශයෙන් මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් අනුගමනය කළේය. ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2016 වසරේ පළමු භාගය තුළ දී සාපේක්ෂව ශීඝ්‍රයෙන් ඉහළ ගොස් දෙවන භාගය තුළ දී පහළ ගිය ද, සමස්තයක් ලෙස සැලකූ විට ඉහළ යන නැඹුරුවක් පෙන්වීය. හිතකර දේශීය සැපයුම් තත්ත්වය සහ 2015 ජනවාරි මාසයේ සාපේක්ෂව පැවැති ඉහළ පදනම් බලපෑම හේතුවෙන්, 2016 ජනවාරි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය -0.7 ක් විය. ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ඉන්පසුව ඉහළ යන නැඹුරුවක් දැක්වූ අතර ජූනි මාසයේ දී සියයට 6.4 ක් ලෙස 2016 වසරේ වාර්තා වූ ඉහළම අගය වාර්තා කළේය. අහිතකර කාලගුණික තත්ත්ව නිසා ආහාර මිල ගණන් ඉහළ යෑම සහ රජයේ බදු සංශෝධන නිසා ආහාර නොවන කාණ්ඩයේ මිල ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ මැයි සහ ජූනි මාසවල දී ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ ගියේය. ආහාර අයිතමවල සැපයුමෙහි ඇති වූ යහපත් තත්ත්වය හේතුවෙන් 2016 ජූලි සහ අගෝස්තු යන මාසවල දී ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සමස්තයක් ලෙස පහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. රජයේ බදු සංශෝධන 2016 ජූලි මාසයේ දී අත්හිටුවීම ද මෙම පහළ යෑම කෙරෙහි සුළු වශයෙන් දායක විය. 2016 නොවැම්බර් මාසයේ දී, රජයේ බදු සංශෝධන නැවත හඳුන්වාදුන් අතර, එම කාලයේ දී පැවැති නියං තත්ත්වයෙහි බලපෑම තරමක් දුරට හේතුකොට ගෙන ආහාර මිල ගණන්ද ඉහළ ගියේය. 2016 වසරේ අග භාගය වන විට ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය මැද තනි ඉලක්කමක ආසන්නයේ පැවැතියේය. මේ අතර, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2016 ජනවාරි මාසයේ දී සියයට 2.9 සිට 2016 දෙසැම්බර් මාසයේ දී සියයට 4.0 දක්වා ඉහළ ගියේය.

**4.1 රූප සටහන**
**උද්ධමනයෙහි විචලන**
**(ජා.පා.මි.ද. (2013=100) සහ කො.පා.මි.ද. (2013=100))**





## කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.)

කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික කලාපවල මිල ප්‍රවණතා මනිනු ලබන කො.පා.මි.ද. 2016 වසර තුළ දී මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. 2016 ජනවාරි මාසයේ දී දර්ශක අංක 110.0 ක් ව පැවැති කො.පා.මි.ද. (2013=100) 2016 දෙසැම්බර් මස වන විට දර්ශක අංක 114.7 දක්වා ඉහළ ගියේය. කො.පා.මි.දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ද ජා.පා.මි. දර්ශකයෙහි උද්ධමනයට සමාන ප්‍රවණතාවක් අනුගමනය කළේය. මේ අනුව, කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2016 ජනවාරි මස දී සියයට 1.7 සිට 2016 ජූලි මාසයේ දී සියයට 5.8 දක්වා ඉහළ ගොස් 2016 දෙසැම්බර් මස දී සියයට 4.5 කරා ළඟා විය. මේ අතර, කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2016 ජනවාරි මාසයේ දී පැවැති සියයට 2.1 සිට 2016 දෙසැම්බර් මාසයේ දී සියයට 4.0 දක්වා ඉහළ ගියේය.

## විශේෂ සටහන 5
## ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල දර්ශකවල විකාශනය

පාරිභෝගික මිල දර්ශක මගින්, සාමාන්‍ය ගෘහ ඒකකයක් විසින් භාවිතයට ගැනෙන භාණ්ඩ හා සේවා පැසෙහි සමස්ත මිල මට්ටම මනිනු ලබයි. පරිභෝජන රටා කාලයත් සමග වෙනස් වන හෙයින් පාරිභෝගික මිල දර්ශකද යාවත්කාලීන කිරීමේ අභ්‍යාස හරහා එම වෙනස්කම් පිළිබිඹු කළ යුතුය. පාරිභෝගික පරිභෝජන හා වියදම් රටා පිළිබඳ සමීක්ෂණවලින් අනාවරණය වන තොරතුරු පදනම් කොට ගෙන පාරිභෝගික මිල දර්ශක යාවත්කාලීන කිරීම ජාත්‍යන්තර සංඛ්‍යාන සකස් කරනු ලබන ආයතන විසින් පුළුල් ලෙස පිළිගත් ක්‍රමවේදයකි.


**රූප සටහන වි.ස. 5.1**
**ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල දර්ශකවල භාණ්ඩ පැසෙහි බර තැබුම් ව්‍යුහය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකාවෙහි පාරිභෝගික මිල දර්ශකවල ඉතිහාසය 1939 තරම් අතීතයට යන අතර එම කාලයේ දී කොළඹ වැඩ කරන පන්තිය නියෝජනය වන ජීවන වියදම් දර්ශකයක් මගින් මිල නැඹුරුතා විශ්ලේෂණ සිදු කෙරිණි. මෙම කොළඹ වැඩ කරන පන්තියේ ජීවන වියදම් දර්ශකයෙහි පදනම් කාල පරිච්ඡේදය වූයේ, 1938 නොවැම්බර් සිට 1939 අප්‍රේල් දක්වා වන කාල පරිච්ඡේදයයි. ඉන් අනතුරුව 1953 දී, පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීමේ වගකීම පැවරී ඇති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවෙහි නිල පාරිභෝගික මිල දර්ශකය ලෙස, පළමු කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) හඳුන්වා දෙන ලදී. පළමු කො.පා.මි. දර්ශකයෙහි පදනම් වර්ෂය 1952 වසර වූ අතර 1949/50 වසරවල දී සිදු කෙරුණු කොළඹ ගෘහස්ථ අයවැය සමීක්ෂණය මගින් අනාවරණය වූ පරිභෝජන හා වියදම් රටා අනුව භාණ්ඩ පැසක් තෝරා ගැනිණි. ඉන් අනතුරුව, කො.පා.මි.ද. 2002 හා ඉන් පසුව 2006/07 යන වසරවලට යාවත්කාලීන කෙරුණු අතර, එම වසරවල දී පැවැත්වූ කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණවලින් අනාවරණය වූ තොරතුරු මත පදනම්ව එය සිදු කෙරිණි. මෑතක දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012/13 වර්ෂවල දී පැවැත් වූ කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණයෙන් අනාවරණය වූ තොරතුරු මත පදනම්ව

**රූප සටහන වි.ස. 5.2**
**පාරිභෝගික මිල දර්ශකවල අයිතම පිළිබඳ වර්ගීකරණය**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 5.3**
**පදනම් වර්ෂවල දී සිදු කෙරුණු මුළු වියදම**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 5.4**
**පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4

කො.පා.මි. දර්ශකයෙහි පදනම් කාල පරිච්ඡේදය 2006/07 වර්ෂවල සිට 2013 වර්ෂය වෙත යාවත්කාලීන කරන ලදී. කො.පා.මි. දර්ශකයෙහි නව ශ්‍රේණිය 2017 ජනවාරි මස සිට නිකුත් කරන ලදී.

මෙම සෑම යාවත්කාලීන කිරීමක් තුළින්ම දර්ශකයේ කැපී පෙනෙන වැඩි දියුණු කිරීම් සහ වෙනස්කම් රාශියක් සිදු කරන ලදී. කාලයත් සමග දර්ශකවල සිදු වූ ප්‍රමුඛතම වෙනස්වීම වනුයේ, පැසෙහි ආහාර හා ආහාර නොවන වියදම් ප්‍රතිශතවල වූ වෙනසයි. කො.පා.මි.ද. (2013=100) හි ආහාර සඳහා වියදම මුළු පරිභෝජන වියදමෙන් සියයට 28.2 කි. මෙය කො.පා.මි.ද. (2006/07=100) හි පැවති සියයට 41.0 ට හා කො.පා.මි.ද. (1952=100) හි පැවති සියයට 61.9 ට සාපේක්ෂව සැලකිය යුතු පහළ යෑමකි. මේ තුළින්, කොළඹ ගෘහ ඒකක ඔවුන්ගේ වියදමෙන් සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ආහාර නොවන අයිතම සඳහා වර්තමානයේ දී වැය කරන බවත්, එය කාලයත් සමග සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවත් පැහැදිළිවම විද්‍යාමාන වේ. එසේ නමුත්, ජාතික පාරිභෝගික මිල දර්ශකයට (ජා.පා.මි.ද.) අනුව සමස්ත රටම නියෝජනය කරන සාමාන්‍ය ගෘහ ඒකකයක් ඔවුන්ගේ මුළු වියදමින් සියයට 44.0 ක ප්‍රතිශතයක් ආහාර සඳහා වැය කරයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ නිකුත් කළ ජා.පා.මි.ද. (2013=100) මගින් ජාතික මට්ටමින් පාරිභෝගිකයන්ගේ පරිභෝජන හා වියදම් රටාවන්හි වෙනස්කම් පිළිබිඹු කෙරෙන අතර, කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයන්ගේ පරිභෝජන හා වියදම් රටාවල වෙනස්කම් පිළිබිඹු කෙරේ. 2013 වසර වෙත කො.පා.මි. දර්ශකයෙහි සිදු කළ යාවත්කාලීන කිරීම කො.පා.මි. දර්ශකයෙහි සහ ජා.පා.මි. දර්ශකයෙහි පදනම් වර්ෂ එක් වසරකට ගලපන ලද නිසා, එය ජාතික හා නාගරික මිල ප්‍රවණතා පහසුවෙන් සංසන්දනය කිරීමට අවකාශ සලසයි.

4

## ආහාර කාණ්ඩයේ මිල විචලන

**ආහාර කාණ්ඩයේ මිල විචලන ප්‍රධාන ලෙස නිතර මිල උච්ඡාවචන සහිත ආහාර අයිතමවල[1] මිල ප්‍රවණතා අනුගමනය කර ඇත.** නිතර මිල උච්ඡාවචන සහිත ආහාර අයිතමවල මිලෙහි සිදු වූ මිශ්‍ර විචලන ප්‍රධාන වශයෙන් වසර තුළ ආහාර උද්ධමනයෙහි ඉහළ යෑම සඳහා හේතු විය. වසරේ මුල් මාස කිහිපය තුළ දී සහල් සහ එළවළු මිල ගණන් මගින් ඇති වූ පීඩනය, හිතකර සැපයුම හේතුකොට ගෙන අවම තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත්, 2016 වසරේ සිව්වන කාර්තුවේ පැවැති නියං තත්ත්වය නිසා වසරේ අවසාන භාගය තුළ දී සහල් මිල ඉහළ යෑම නිසා ඇති වූ උද්ධමනකාරී පීඩනය කැපී පෙනුණි. තවද, ගංවතුර හේතුවෙන් සැපයුම අඩාල වීම 2016 අප්‍රේල් සිට ජූලි දක්වා එළවළු මිල සැලකිය යුතු ලෙස ඉහළ යෑමට ප්‍රධාන ලෙස බලපෑවේය. වසරේ අවසන් මාස කිහිපය තුළ පැවැති නියං තත්ත්වය එළවළු මිල මත තරමක ඉහළ පීඩනයක් ඇති කළේය. කරදිය ධීවර කටයුතු

1 නිතර මිල උච්ඡාවචන සහිත අයිතම කාණ්ඩය තුළ සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පළතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.

**4.2 සංඛ්‍යා සටහන**

**උප කාණ්ඩ අනුව වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සඳහා දායකත්වය - 2016**

| දර්ශකය | කො.පා.මි.ද (2013=100) ප්‍රතිශත | | ජා.පා.මි.ද (2013=100) ප්‍රතිශත | |
|---|---|---|---|---|
| | වෙනස | දායකත්වය | වෙනස | දායකත්වය |
| **සියලුම ශීර්ෂ** | **4.0** | **100.0** | **4.0** | **100.0** |
| ආහාර හා මද්‍යසාර නොවන පාන වර්ග | **6.1** | **44.0** | **3.1** | **34.7** |
| ආහාර නොවන, මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ | **3.1** | **56.0** | **4.6** | **65.3** |
| මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ | 20.8 | 6.4 | 22.1 | 15.0 |
| රෙදිපිළි හා පාවහන් | 6.5 | 3.9 | 3.7 | 3.2 |
| නිවාස, ජලය, විදුලි, ගෑස් හා වෙනත් ඉන්ධන | -0.2 | -1.5 | 0.1 | 0.6 |
| ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තුව | 0.3 | 0.2 | 4.1 | 3.4 |
| සෞඛ්‍ය | 12.9 | 14.7 | 11.5 | 12.4 |
| ප්‍රවාහන | 2.0 | 4.5 | 5.1 | 10.7 |
| සන්නිවේදන | 6.3 | 5.0 | 6.8 | 3.8 |
| විනෝදාත්මක හා සංස්කෘතික | 2.0 | 0.6 | 2.7 | 1.1 |
| අධ්‍යාපන | 5.0 | 7.4 | 2.4 | 1.8 |
| ආපනශාලා සහ හෝටල් | 2.6 | 3.2 | 1.9 | 1.8 |
| විවිධ භාණ්ඩ හා සේවා | 14.5 | 11.6 | 10.6 | 11.5 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.3 සංඛ්‍යා සටහන**

**ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමවල සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2013=100) බර තැබීම් (%) | මිල රුපියල් | | | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික සාමාන්‍යය | | | 2014 දෙසැ | 2015 දෙසැ | 2016 දෙසැ | වාර්ෂික සාමාන්‍යය | | ලක්ෂ්‍යමය | |
| | | | 2014 | 2015 | 2016 | | | | 2015/ 2014 | 2016/ 2015 | 2015 දෙසැ/ 2014 දෙසැ | 2016 දෙසැ/ 2015 දෙසැ |
| **දේශීය** | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 1.47 | 84.14 | 91.20 | 92.75 | 92.77 | 95.43 | 95.90 | 8.4 | 1.7 | 2.9 | 0.5 |
| රතු කැකුළු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.65 | 75.28 | 76.57 | 69.52 | 91.90 | 71.46 | 84.08 | 1.7 | -9.2 | -22.2 | 17.6 |
| සුදු කැකුළු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.46 | 71.75 | 69.30 | 72.12 | 78.19 | 67.46 | 88.56 | -3.4 | 4.1 | -13.7 | 31.3 |
| නාඩු සහල් | කි.ග්‍රෑ.1ක් | 0.36 | 78.37 | 77.95 | 78.71 | 87.56 | 79.14 | 91.41 | -0.5 | 1.0 | -9.6 | 15.5 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | ගෙඩියක් | 1.82 | 45.63 | 50.49 | 46.12 | 47.04 | 47.37 | 49.57 | 10.7 | -8.6 | 0.7 | 4.6 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 0.76 | 741.22 | 799.29 | 860.68 | 744.35 | 813.74 | 876.66 | 7.8 | 7.7 | 9.3 | 7.7 |
| බෝංචි | කි.ග්‍රෑ.1ක් | 0.30 | 163.87 | 209.53 | 204.75 | 207.49 | 292.89 | 233.86 | 27.9 | -2.3 | 41.2 | -20.2 |
| වම්බටු | කි.ග්‍රෑ.1ක් | 0.15 | 110.34 | 123.87 | 133.08 | 137.20 | 170.30 | 110.60 | 12.3 | 7.4 | 24.1 | -35.1 |
| බිත්තර | එකක් | 0.30 | 12.75 | 14.80 | 16.10 | 12.78 | 15.60 | 15.63 | 16.1 | 8.7 | 22.0 | 0.2 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 0.63 | 101.71 | 87.80 | 100.69 | 100.37 | 90.85 | 97.68 | -13.7 | 14.7 | -9.5 | 7.5 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400ක් | 2.16 | 379.13 | 330.08 | 325.00 | 386.00 | 325.00 | 325.00 | -12.9 | -1.5 | -15.8 | 0.0 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.68 | 162.80 | 184.07 | 191.16 | 170.34 | 178.09 | 196.08 | 13.1 | 3.9 | 4.5 | 10.1 |
| තිරිඟු පිටි | කි.ග්‍රෑ.1ක් | 0.18 | 97.80 | 87.43 | 89.66 | 97.84 | 86.43 | 89.10 | -10.6 | 2.5 | -11.7 | 3.1 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සාමාන්‍ය මට්ටමක පැවතීම සහ මිරිදිය ධීවර කටයුතු ඉහළ යෑම සමග නැවුම් මත්ස්‍ය මිල මිශ්‍ර විචලන දැක්වීය. පොල් මිල ගණන් පහළ යන ප්‍රවණතාවක් 2016 අගෝස්තු මස දක්වා පැවැති අතර එතැන් සිට පොල් මිල ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. මේ අතර, ජීවන වියදමෙහි ඉහළ යෑම පාලනය කිරීම සඳහා රජය විසින් 2016 ජූලි මස මැද දී, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 16 කට උපරිම සිල්ලර මිල සීමා ප්‍රකාශයට පත් කරන ලැබුවද, උද්ධමනකාරී පීඩනය ලිහිල් කිරීම කෙරෙහි උපරිම සිල්ලර මිලෙහි බලපෑම සුළු විය.

**2015 වසරට සාපේක්ෂව 2016 දී ආනයනික අයිතමවල දේශීය මිල ගණන් ඉහළ ගියේය.** ජාත්‍යන්තර වෙළඳපොළේ පාරිභෝගික භාණ්ඩ මිල ඉහළ යෑම සහ ප්‍රධාන විදේශ මුදල්වලට සාපේක්ෂව දේශීය මුදලේ අගය පහත වැටීම මෙම ඉහළ යෑම සඳහා හේතු වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගණනය කරනු ලබන වෙළඳ දර්ශකවලින් පෙන්නුම් කරයි. පෙර වසරට සාපේක්ෂව 2016 වසර තුළ දී දේශීය වෙළඳපොළ තුළ සීනි, පරිප්පු සහ තිරිඟු පිටි මිල ගණන් ඉහළ ගියේය. තිරිඟු පිටි මිල ඉහළ යෑමෙන් අනතුරුව පාන් රාත්තලක මිලද ඉහළ ගිය අතර, මෙම මිල විචලන පොදු මිල මට්ටම කෙරෙහි යම් මට්ටමක පීඩනයක් ඇති කළේය. තවදුරටත්, සැපයුම් අංශයෙහි ප්‍රවණතා තුලනය කිරීම සඳහා සමහර ආනයනික භාණ්ඩ සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිහිප විටක දී සංශෝධනය කරන ලදී. දේශීය ගොවීන්ගේ ශුභසිද්ධිය උදෙසා අස්වනු නෙළන කාලවල දී ආනයන අධෛර්යමත් කිරීමේ අරමුණින් අර්තාපල්, රතුළූණු, ලොකු ළූණු වැනි ආනයනික භාණ්ඩ මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නංවන ලදී. තවද, උපරිම සිල්ලර මිල ප්‍රකාශයට පත්කළ විට දී වෙළඳපොළ සිල්ලර මිල ගණන් ඒ අනුව පවත්වා ගැනීම සඳහා ආනයනික සීනි මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට ශත 25 දක්වා සැලකිය යුතු ලෙස අඩු කෙරිණි. එසේ වුවද, දේශීය සීනි නිෂ්පාදනය ධෛර්යමත් කිරීම සඳහා වසරේ දෙවන භාගයේ අවස්ථා කිහිපයක දී සීනි මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දමන ලදී.

## ආහාර නොවන සහ අනෙකුත් කාණ්ඩවල මිල විචලන

**ආහාර නොවන සහ අනෙකුත් කාණ්ඩවල මිලෙහි හැසිරීම මිශ්‍ර විචලන සහිතව, සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුවක් දැක්වීය.** මෙම මිල හැසිරීම් සඳහා කලින් කලට සිදු වූ මිල වෙනස්වීම් මෙන්ම පරිපාලිත මැදිහත්වීම් හේතුවෙන් මිලෙහි සිදු වූ වෙනස්කම් ද ප්‍රධාන වශයෙන් හේතු විය. සෞඛ්‍ය සහ සන්නිවේදන උප කාණ්ඩවල සිදු වූ මිල ඉහළ යෑම් සඳහා 2016 වසරේ රජයේ බදු සංශෝධන හේතු විය. මේ අතර, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2016 ඔක්තෝබර් මාසයේ දී, තෝරාගත් ඖෂධීය නිෂ්පාදන 48 ක් සඳහා උපරිම සිල්ලර මිල සීමා නියම කරන ලදී. 2017 අයවැය මගින් ප්‍රකාශයට පත් වූ පරිදි 2016 නොවැම්බර් 29 වන දින සිට නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩය තුළ ද්‍රව පෙට්‍රෝලියම් වායු (එල්.පී.ගෑස්) මිල රුපියල් 25 කින් අඩු කෙරුණි. ප්‍රවාහන උප කාණ්ඩය තුළ 2016 අගෝස්තු 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, බස් ගාස්තු සියයට 6.0 කින් ඉහළ දමන ලදී.

**2016 වසරේ අවස්ථා කිහිපයක දී රජය විසින් හඳුන්වාදුන් බදු සංශෝධන ආහාර නොවන කාණ්ඩයේ මිල මත සෘජු බලපෑමක් ඇති කළේය.** 2016 මැයි

4

මාසයේ දී, එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 11 සිට සියයට 15 දක්වා ඉහළ දැමූ අතර, පාරිභෝගික මිල දර්ශක පැසෙහි ඇති උප කාණ්ඩ කිහිපයක් (සන්නිවේදන සහ සමහර සෞඛ්‍ය අයිතම) සඳහා පැවැති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් අත්හිටුවන ලදී. ඒ අනුව, සෞඛ්‍ය සහ සන්නිවේදන උප කාණ්ඩ තුළ ඇති අදාළ උප අංශවල මිල ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, එකතු කළ අගය මත බදු ඉහළ දැමීම 2016 ජූලි මාසයේ දී අත්හිටුවන ලදී. එසේ නමුත්, එකතු කළ අගය මත බදු වැඩිවීම අත්හිටුවීමට ප්‍රතිචාර ලෙස නිරීක්ෂණය කළ මිල ගණන් අපේක්ෂිත පරිදි පහළ යෑමක් විශේෂයෙන්ම සෞඛ්‍ය උප කාණ්ඩයේ දක්නට නොලැබිණි. අනතුරුව, 2016 නොවැම්බර් මස දී නැවතත් එකතු කළ අගය මත බදු ඉහළ දැමීම නැවත ක්‍රියාත්මක වූ අතර එය ප්‍රධාන වශයෙන්ම ආහාර නොවන අයිතමයන්හි මිල ඉහළ යෑමට හේතු විය.

## මූලික උද්ධමනය

**ආර්ථිකයේ ඉල්ලුම් පීඩනයක් පැවැති බව පිළිබිඹු කරමින්, මූලික ජා.පා.මි.ද. හා මූලික කො.පා.මි.ද. යන දර්ශක දෙකෙහිම ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ යන ප්‍රවණතාවක් වසර තුළ පෙන්නුම් කළේය.** රජයේ බදු සංශෝධන හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමග මූලික උද්ධමනය 2016 මැයි මාසයේ දී තියුණු වැඩිවීමක් වාර්තා කළේය. 2016 ජූලි සහ අගෝස්තු මාසවල දී වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ තියුණු අඩුවීමට රජයේ බදු සංශෝධන අත්හිටුවීම තරමක් දුරට හේතු විය. නැවතත් රජයේ බදු සංශෝධන ක්‍රියාත්මක වීම හේතුවෙන් 2016 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී මූලික උද්ධමනය ඉහළ ගියේය. එමනිසා, ජා.පා.මි. දර්ශකයෙහි මූලික උද්ධමනය 2016 ජනවාරි මාසයේ දී සියයට 3.0 හි සිට 2016 ජුනි මාසයේ දී සියයට 7.5

**4.4 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල සහිත ප්‍රධාන අයිතම**

| අයිතමය | | ඒකකය | මිල (වසර අග) - රුපියල් | | | ප්‍රතිශත වෙනස (අ) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 2014 | 2015 | 2016 | 2014/2013 | 2015/2014 | 2016/2015 |
| බීසල් - ලං. බ. නි. සං. | | ලී. 1ක් | 111.00 | 95.00 | 95.00 | -8.3 | -14.4 | - |
| බීසල් - ලං. ඉ. තෙ. සං. | | ලී. 1ක් | 111.00 | 95.00 | 95.00 | -8.3 | -14.4 | - |
| භූමිතෙල් | | ලී. 1ක් | 81.00 | 49.00 | 44.00 | -23.6 | -39.5 | -10.2 |
| පෙට්‍රල් | | ලී. 1ක් | 150.00 | 117.00 | 117.00 | -7.4 | -22.0 | - |
| ගෑස් - ලිට්‍රො | | කි.ග්‍රෑ. 12.5 | 1,896.00 | 1,346.00 | 1,321.00 | -20.9 | -29.0 | -1.9 |
| ගෑස් - ලාෆ් | | කි.ග්‍රෑ. 12.5 | 1,896.00 | 1,346.00 | 1,321.00 | -20.9 | -29.0 | -1.9 |
| ඇව්තෙල් (1500) | | ලී. 1ක් | 90.00 | 80.00 | 80.00 | - | -11.1 | - |
| ඇව්තෙල් (3500) | | ලී. 1ක් | 90.00 | 80.00 | 80.00 | - | -11.1 | - |
| විදුලිය ගාස්තු - ස්ථාවර (ආ) | ගාස්තු කාණ්ඩය | ඒකක 0-30 | 30.00 | 30.00 | 30.00 | - | - | - |
| | | ඒකක 31-60 | 60.00 | 60.00 | 60.00 | - | - | - |
| | | ඒකක 61-90 | 90.00 | 90.00 | 90.00 | - | - | - |
| | | ඒකක 91-180 | 480.00 | 480.00 | 480.00 | 52.4 | - | - |
| | | ඒකක 180 ට වැඩි | 540.00 | 540.00 | 540.00 | 28.6 | - | - |
| විදුලිය ගාස්තු - ඒකක (ආ) | ගාස්තු කාණ්ඩය | | | | | | | |
| | ඒකක 60 ට අඩු | ඒකක 0-30 | 2.50 | 2.50 | 2.50 | -16.7 | - | - |
| | | ඒකක 31-60 | 4.85 | 4.85 | 4.85 | 3.2 | - | - |
| | ඒකක 60 ට වැඩි | ඒකක 0-60 | 7.85 | 7.85 | 7.85 | -21.5 | - | - |
| | | ඒකක 61-90 | 10.00 | 10.00 | 10.00 | -16.7 | - | - |
| | | ඒකක 91-120 | 27.75 | 27.75 | 27.75 | 4.7 | - | - |
| | | ඒකක 121-180 | 32.00 | 32.00 | 32.00 | 4.9 | - | - |
| | | ඒකක 180 ට වැඩි | 45.00 | 45.00 | 45.00 | 7.1 | - | - |
| ජල ගාස්තු - ඒකක (ඇ) | ගාස්තු කාණ්ඩය | ඒකක 0-5 | 8.00 | 8.00 | 8.00 | - | - | - |
| | | ඒකක 6-10 | 11.00 | 11.00 | 11.00 | - | - | - |
| | | ඒකක 11-15 | 20.00 | 20.00 | 20.00 | - | - | - |
| | | ඒකක 16-20 | 40.00 | 40.00 | 40.00 | - | - | - |
| | | ඒකක 21-25 | 58.00 | 58.00 | 58.00 | - | - | - |
| | | ඒකක 26-30 | 88.00 | 88.00 | 88.00 | - | - | - |
| | | ඒකක 31-40 | 105.00 | 105.00 | 105.00 | - | - | - |
| | | ඒකක 41-50 | 120.00 | 120.00 | 120.00 | - | - | - |
| | | ඒකක 51-75 | 130.00 | 130.00 | 130.00 | - | - | - |
| | | ඒකක 75 ට වැඩි | 140.00 | 140.00 | 140.00 | - | - | - |
| බස් ගාස්තු (ඈ) | | | | | | - | -8.2 | 6.0 |

(අ) '-' මගින් කාලපරිච්ඡේදය තුළදී පරිපාලිත මිල ගණන්වල වෙනසක් සිදු නොවූ බව දක්වයි.

(ආ) 2014.09.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය සඳහා වූ ස්ථාවර ගාස්තු සහ ඒකක ගාස්තු පහළ දමන ලදී.

(ඇ) 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකක 25 ට වඩා අඩු පරිභෝජනයක් සහිත ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ ජල බිල්පතෙහි වටිනාකමෙන් සියයට 10 ක අඩු කිරීමක් ලබා දෙන ලදී.

(ඈ) 2016.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මගී බස් ගාස්තු සියයට 6 කින් ඉහල දමන ලදී. අවම බස් ගාස්තුව රුපියල් 8.00 සිට රුපියල් 9.00 දක්වා ඉහල දමන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


දක්වා ඉහළ ගොස් 2016 දෙසැම්බර් මාසයේ දී සියයට 6.7 හි ස්ථාවර විය. මේ අතර, කො.පා.මි. දර්ශකයෙහි මූලික උද්ධමනය 2016 ජනවාරි මාසයේ දී සියයට 3.6 හි සිට 2016 දෙසැම්බර් මස වන විට සියයට 5.8 කරා ළඟා විය.

**ඉල්ලුම් අංශයේ ප්‍රවණතා හේතුවෙන් මිල මට්ටම ඉහළ යෑම කෙරෙහි යම් ප්‍රමාණයක පීඩනයක් පැවැති බව විශේෂයෙන්ම 2016 වසරේ මුල් කාලයේ දී සිදු වූ මූලික උද්ධමනයේ වැඩිවීම තුළින් පෙන්නුම් කෙරිණි.** 2015 හා 2016 වසරවල දී බැංකු මගින් පෞද්ගලික අංශයට ලබාදුන් ණය ඉහළ වේගයකින් වර්ධනය විය. ණය වර්ධන වේගය පාලනය කිරීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාවලියට ප්‍රතිචාර ලෙස 2016 වසරේ දෙවන භාගය තුළ දී ණය වර්ධන වේගය මන්දගාමී වීම ආරම්භ විය. මේ අතර, ආර්ථිකයේ වැටුප් ඉහළ වේගයකින් වර්ධනය විය. 2015 වසරේ දී හා 2016 වසරේ මුල් කාලයේ දී විශේෂයෙන් රාජ්‍ය අංශයේ වැටුප් ඉහළ යෑම සමග මූර්ත ආදායම් මට්ටම් ද ඉහළ යන ලදී. විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යෑමට හේතු වූ පනත් කිහිපයක් 2016 වසර තුළ දී සම්පාදනය විය. අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ද රාජ්‍ය අංශයේ සහ විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්වල උපනතියම අනුගමනය කළේය. මිල ඉහළ යෑම කෙරෙහි ඉල්ලුම් පාර්ශ්වයෙන් යම් ප්‍රමාණයක බලපෑමක් ඇතිවීමට මෙම කරුණු දායක විය.

**අදාළ කාලය තුළ දී මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල සිදු වූ සංශෝධනවලට යම් ප්‍රමාණයක ප්‍රතිචාර දක්වමින් උද්ධමන අපේක්ෂා ස්ථාවරව පැවැතිණි.** ව්‍යාපාර අංශයෙහි ප්‍රතිචාර දක්වන්නන්ගේ උද්ධමන අපේක්ෂා මැද-තනි අගයක් ආසන්නයේ ස්ථාවරව පැවති අතර 2016 වසරේ මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල හඳුන්වා දුන් වෙනස්කම්වලට අනුකූලව එම උද්ධමන අපේක්ෂා වෙනස් වන බව පෙන්නුම් කළේය. කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා ද ප්‍රතිපත්ති සංශෝධන අනුව වෙනස් වූ අතර, විශේෂයෙන් වසර තුළ දී හඳුන්වා දුන් රජයේ බදු සංශෝධනවලට අනුගාමීව පැවතිණි. කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා සාමාන්‍යයෙන් ව්‍යාපාර අංශයේ ප්‍රතිචාර දක්වන්නන්ගේ උද්ධමන අපේක්ෂාවලට වඩා ඉහළ මට්ටමක පවතින අතර, එය ඉහළ තනි අගයක් වටා ස්ථාවරව පැවතිණි.

**4.2 රූප සටහන**

**ලක්ෂ්‍යමය මූලික උද්ධමනයෙහි විචලන**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.5 සංඛ්‍යා සටහන**

**දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

(2010=100)

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2014 (අ) | 2015 (අ) | 2016 (ආ) | 2015/2014 (අ) | 2016/2015 (ආ) |
| කෘෂිකර්මාන්ත | 129.7 | 133.5 | 138.7 | 3.0 | 3.9 |
| කර්මාන්ත | 132.1 | 132.1 | 132.8 | -0.1 | 0.5 |
| සේවා | 127.7 | 128.4 | 132.5 | 0.6 | 3.2 |
| **ද.දේ.නි.** | **125.8** | **126.8** | **131.4** | **0.8** | **3.6** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.)

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන නි.මි.ද. (2013 සිව්වන කාර්තුව=100) විචලන මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය, 2016 වසර තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** නි.මි.ද. මගින් ආර්ථිකයෙහි කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගිතා (විදුලිය හා ජලය) යන අංශ ආවරණය කරයි. සමස්තයක් ලෙස කෘෂිකර්මාන්ත හා නිෂ්පාදන උප දර්ශකවල වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස ඉහළ යන නැඹුරුවක් පෙන්වූ අතර, විදුලිය හා ජලය උප දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස පහළ යන ප්‍රවණතාවක් 2016 වසරේ දී පෙන්නුම් කළේය. මේ සඳහා ප්‍රධාන ලෙස හේතු වූයේ 2015 වසර හා සැසඳීමේදී 2016 වසරේ දී සමස්ත විදුලි නිෂ්පාදන පිරිවැය පහත වැටීම වූ අතර, එය 2016 පළමු භාගයේ වැසි සමයත් සමග අඩු පිරිවැයක් සහිත ජල විදුලි උත්පාදනය ඉහළ යෑම නිසා සිදු විය.

## දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**දේශීයව නිපදවනු ලබන සියලුම භාණ්ඩ සහ සේවාවල සමස්ත මිල වෙනස්වීම් මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය, ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනෙහිම මිල ඉහළ යෑම නිසා ඉහළ ගියේය.** කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශවල මිල ගණන් 2015 වසරේ වාර්තා වූ සියයට 3.0, සියයට -0.1 සහ සියයට 0.6 සිට 2016 වසරේ දී පිළිවෙළින් සියයට 3.9, සියයට 0.5 සහ සියයට 3.2 දක්වා ඉහළ ගියේය. ඒ

4

අනුව, සමස්ත ද.දේ.නි. අවධමනකය 2015 වසරේ වූ සියයට 0.8 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 3.6 දක්වා ඉහළ ගියේය. 2016 වසර තුළ දී ජා.පා.මි.ද. සහ කො.පා.මි. දර්ශකයෙහි උද්ධමනය ද.දේ.නි. අවධමනකයට වඩා ඉහළ මට්ටමක පැවතිණි.

## 4.3 වැටුප්

**මෑත කාලීන ආර්ථික ප්‍රවණතාවලට අනුරූපව රාජ්‍ය සහ පෞද්ගලික අංශවල වැටුප් ගැලපීම සඳහා 2016 වසර තුළ දී සැලකිය යුතු වෙනස්කම් හඳුන්වා දෙන ලදී.** රාජ්‍ය අංශය ගත් කල, නව වැටුප්තල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් එම අංශය සඳහා නව වැටුප් චක්‍රලේඛයක්[2] නිකුත් කෙරිණි. තවද, 2016 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2014 සහ 2015 වසරවල දී හඳුන්වා දුන් රුපියල් 10,000 ක අතුරු දීමනාව වාර්ෂික පියවර 5 කින් මූලික වැටුපට එකතු කරන ලදී. මෙම වැඩි වූ වැටුප් ගෙවීම ආරම්භ කිරීමත් සමග රාජ්‍ය අංශයේ වැටුප්වල සැබෑ වෙනස්වීම, 2016 මාර්තු මස සිට දක්නට ලැබිණි. 2016 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පෞද්ගලික අංශය සඳහා රුපියල් 10,000 ක ජාතික අවම වැටුපක්[3] නීතිගත කරන ලදී. තවද, අයවැය සහන දීමනාව[4] සඳහා සුදුසුකම් ලබන වැටුප් සීමාව රුපියල් 20,000 සිට රුපියල් 40,000 දක්වා ඉහළ දැමීම හේතුවෙන් එමගින් ආවරණය වන සේවක සංඛ්‍යාව 2016 වසරේ දී පුළුල් කෙරිණි.

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2016 වසරේ දී ඉහළ ගියේය.** 2015 වසර තුළ දී අතුරු දීමනාව රුපියල් 10,000 දක්වා පියවර වශයෙන් වැඩි කිරීම සහ 2016 වසරේ දී අතුරු දීමනාවෙන් කොටසක් මූලික වැටුපට එකතු කිරීම හේතුවෙන් වැටුප් දර්ශකයෙහි 2015 වසරේ වාර්තා වූ සාමාන්‍ය අගයට වඩා ඉහළ සාමාන්‍ය අගයක් 2016 වසරේ දී වාර්තා වීම මෙම වර්ධනය සඳහා හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍ය සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරේ වාර්තා වූ සියයට 31.7 ක සැලකිය යුතු ඉහළ යෑමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 3.9 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, නාමික වැටුප්වල වර්ධනය උද්ධමන අනුපාතිකයට

2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016

3 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වැටුප් පනත

4 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත

**4.6 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත (අ) | | | නාමික | | | මූර්ත | | |
| | 2014 | 2015 | 2016 (ආ) | 2014 | 2015 | 2016 (ආ) | 2014 | 2015 | 2016 (ආ) | 2014 | 2015 | 2016 (ආ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| **මධ්‍යම රජයේ සේවකයන් (2012=100)** | **117.5** | **154.8** | **160.8** | **111.1** | **141.1** | **140.9** | **10.5** | **31.7** | **3.9** | **6.7** | **27.0** | **-0.1** |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් | 119.2 | 162.9 | 170.4 | 112.7 | 148.5 | 149.4 | 11.6 | 36.6 | 4.6 | 7.7 | 31.8 | 0.6 |
| ද්විතීයික මට්ටමේ නිලධාරීන් | 117.9 | 155.8 | 161.6 | 111.4 | 142.0 | 141.7 | 10.7 | 32.2 | 3.7 | 6.9 | 27.4 | -0.2 |
| තෘතීයික මට්ටමේ නිලධාරීන් | 116.4 | 149.0 | 155.5 | 110.0 | 135.8 | 136.3 | 9.8 | 28.0 | 4.4 | 6.0 | 23.4 | 0.4 |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් | 110.8 | 134.6 | 141.4 | 104.8 | 122.7 | 123.9 | 7.0 | 21.5 | 5.0 | 3.3 | 17.1 | 1.0 |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| **සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් (1978 දෙසැ=100)** | **4,012.2** | **4,127.1** | **4,127.9** | **105.3** | **107.3** | **103.5** | **3.7** | **2.9** | **0.0** | **0.4** | **1.9** | **-3.6** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලෙන කම්කරුවන් | 4,560.9 | 4,734.4 | 4,735.7 | 119.7 | 123.1 | 118.8 | 2.8 | 3.8 | 0.0 | -0.5 | 2.9 | -3.5 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලෙන කම්කරුවන් | 3,459.1 | 3,459.1 | 3,459.1 | 90.8 | 90.0 | 86.8 | 8.4 | 0.0 | 0.0 | 5.0 | -0.9 | -3.6 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 2,313.2 | 2,313.2 | 2,313.2 | 60.7 | 60.2 | 58.0 | 3.2 | 0.0 | 0.0 | 0.0 | -0.9 | -3.6 |
| 3. අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් | | | | | | | | | | | | |
| **සියලුම අවිධිමත් පෞද්ගලික අංශ (2012=100)** | **118.1** | **126.7** | **136.7** | **111.6** | **115.5** | **119.8** | **7.6** | **7.3** | **7.9** | **3.8** | **3.5** | **3.7** |
| කෘෂිකර්මාන්ත | 118.3 | 128.3 | 136.9 | 111.8 | 116.9 | 119.9 | 6.3 | 8.5 | 6.7 | 2.7 | 4.6 | 2.6 |
| කර්මාන්ත | 119.0 | 129.0 | 140.7 | 112.5 | 117.5 | 123.3 | 8.2 | 8.4 | 9.1 | 4.4 | 4.5 | 4.9 |
| සේවා | 117.1 | 123.9 | 132.8 | 110.6 | 112.9 | 116.4 | 7.5 | 5.9 | 7.2 | 3.8 | 2.0 | 3.1 |

(අ) රජයේ සේවකයන් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා වන මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක, ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර පඩි පාලක සභාවලට අයත් කම්කරුවන් සඳහා වන මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය කො.පා.මි.ද. (2006/07=100) මත පදනම් වේ.

(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### විශේෂ සටහන 6


## ආර්ථිකයේ වැටුප් ප්‍රවණතා මිනුම්ගත කිරීම

වැටුප් දර්ශක මගින් ඉදිරියේ දී ඇති විය හැකි උද්ධමන පීඩන හා නිෂ්පාදන පිරිවැය ගතිකත්ව පිළිබඳව අවබෝධයක් සපයන අතරම, එම දර්ශක ශ්‍රම වෙළඳපොළෙහි සහ ආර්ථිකයෙහි ඉල්ලුම් අංශයේ ප්‍රවණතා පිළිබඳ ප්‍රමුඛ දර්ශක ලෙස ද භාවිතා වේ. කම්කරු වැටුප් ඔවුන්ගේ පරිභෝජන, ඉතුරුම් හා ආයෝජන තීරණ හරහා ආර්ථිකයේ ඉල්ලුම් ප්‍රවණතා සකස් කරනු ලබයි.

ගෝලීය වශයෙන් සැලකූ විට, විවිධ රටවල්වල වැටුප් පිළිබඳ සංඛ්‍යාලේඛන නොයෙක් ආකාරවලින් ප්‍රකාශයට පත් කෙරේ. ඇතැම් රටවල් විශේෂිත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබන අතර සමහර රටවල් එය පැයක ඉපැයීම්වල සාමාන්‍යය අගය (average hourly earnings) ආකාරයෙන් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රම සංඛ්‍යාලේඛන කාර්යාංශය (United States Bureau of Labour Statistics) මගින් ප්‍රකාශයට පත් කෙරෙන ශ්‍රම මිල දර්ශකය (Employment Cost Index), එම රටෙහි ස්ථාවර "රැකියා පැසක" පැයක ගෙවීම්වලට අදාළ විචලන මැනීම අරමුණු කරගත් දර්ශකයකි. 2012 වසර මත පදනම් වන යුරෝපීය කලාපයේ ශ්‍රම පිරිවැය දර්ශකය, වැඩ කළ පැයක ශ්‍රම පිරිවැයෙහි ලැස්පියර් දර්ශකය (Laspeyers index of the labour cost per hour worked) ලෙස නිර්වචනය වේ. එය ආර්ථික ක්‍රියාකාරකම්වල ස්ථාවර ව්‍යුහයක් මත පදනම් වන අතර වාර්ෂික දාම වශයෙන් සම්බන්ධ වූ දර්ශකයකි (chain linked index) (ec.europa.eu, 2017). එක්සත් රාජධානිය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ පැයක කාලයක් සඳහා වන ශ්‍රම පිරිවැය දර්ශකයකි (Index of Labour Cost per Hour). එය එක්සත් රාජධානියෙහි පැයක දී කරන ඉපැයීම් සම්බන්ධ එකම කෙටිකාලීන දර්ශකය ලෙස භාවිතා වේ. එංගලන්ත මහ බැංකුව (Bank of England) සහ එක්සත් රාජධානියේ මහ භාණ්ඩාගාරය මගින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මුල් ඇඟවීම් සපයන වැදගත් මිනුමක් ලෙස මෙම දර්ශකය භාවිතා කරයි.

ශ්‍රී ලංකාවේ භාවිතා වන්නේ වැටුප් ප්‍රමාණ දර්ශක වන අතර, රාජ්‍ය, විධිමත් පෞද්ගලික හා අවිධිමත් පෞද්ගලික යන අංශ සඳහා එම දර්ශක ගණනය කරනු ලබයි. රාජ්‍ය අංශය ගත් කළ, එම අංශයෙහි වැටුප් විචලන අධීක්ෂණය කිරීම සඳහා පදනම් වර්ෂය 2012 වූ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයක් ගණනය කෙරේ. මේ සඳහා දත්ත ලබාගන්නේ රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛවලිනි. මෙම දර්ශකය මගින් රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛවලට අනුකූලව රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතියීය සහ ප්‍රාථමික නම් වූ කාණ්ඩ හතරෙහි සේවක වැටුප් විචලන මනිනු ලබයි.


### රූප සටහන වි.ස. 6.2
### ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙහි සංයුතිය - 2015




සමස්ත සේවා නියුක්තිය මිලියන 7.8කි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන වි.ස. 6.1
### වැටුප් විශ්ලේෂණයෙහි ව්‍යුහය




1 විධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් විශ්ලේෂණය පඩිපාලක සභා 21ක ලියාපදිංචි වී ඇති සේවකයන් මත පදනම් වේ.

2 අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් විශ්ලේෂණය කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල ක්‍රියාකාරකම් 4,250 දක්වා සම්බන්ධ අවිධිමත් රැකියා මත පදනම් වේ.

### රූප සටහන වි.ස. 6.3
### වර්තමාන වැටුප් ප්‍රමාණ දර්ශකවල ලක්ෂණ

| ලක්ෂණය | අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය | රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය | පඩිපාලක සභා වැටුප් ප්‍රමාණ දර්ශකය |
|---|---|---|---|
| ඉලක්කගත සංගහනය | දළ වශයෙන් සේවකයන් මිලියන 4.49 | සියලුම රාජ්‍ය අංශයේ සේවකයන් | පඩිපාලක සභාවල සේවකයන් |
| පදනම් වසර | 2012 | 2012 | 1978 (දෙසැ.) |
| කාල ප්‍රාන්තරය | මාසික | මාසික | මාසික |
| බර තැබුම් ව්‍යුහය | කෘෂිකර්මාන්ත 17.9%<br>කර්මාන්ත 40.2%<br>සේවා 41.9% | ජ්‍යෙෂ්ඨ 5.5%<br>තෘතියික 4.8%<br>ද්විතියික 83.3%<br>ප්‍රාථමික 6.4 | කෘෂිකර්මාන්ත 66%<br>කර්මාන්ත 18%<br>සේවා 16% |

අවිධිමත් පෞද්ගලික අංශය සැලකීමේ දී, එම අංශයෙහි වැටුප් තීරණය වන්නේ වෙළඳපොළ බලවේග මත වන අතර, මෙම වැටුප්, ශ්‍රම වෙළඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් සාධකවල සිදුවන විචලනවලට අනුකූලව සකස් වේ. මුල් කාල වකවානුවල දී මෙම අංශයේ සේවකයින්ට අදාළ වැටුප් ප්‍රවණතා, දෛනික වැටුප්වල සාමාන්‍යයෙහි විචලන අනුව විශ්ලේෂණය කෙරිණි. 2014 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ තුළින් ලබාගත් දත්ත භාවිත කර, පදනම් වර්ෂය 2012 වූ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයක් හඳුන්වා දෙන ලදී. මෙම වැටුප් ප්‍රමාණ දර්ශකය මගින් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රවණතා සමස්තයක් ලෙස විශ්ලේෂණය කිරීමට හැකි විය. මෙම දර්ශකය සම්පාදනය කිරීමේ දී සේවා නියුක්තියෙහි ඍතුමය ස්වභාවය අනුව, ක්‍රියාකාරකම් 4,250 ක් පමණ සෑම මසකදීම සමීක්ෂණයට බඳුන් කෙරේ.

ශ්‍රී ලංකාවේ විධිමත් පෞද්ගලික අංශය සළකා බලන කල, එම අංශයෙහි වැටුප් විචලන, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන පඩිපාලක සභා වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැ=100) මගින් විශ්ලේෂණය කරනු ලැබේ. පඩිපාලක සභා වැටුප් ප්‍රමාණ දර්ශකය, යල්පිනූ පදනම් වර්ෂයකින් යුතුවීම සහ ආර්ථිකයේ පවතින ආංශික සංයුතිය නියෝජනය නොකිරීම වැනි අඩුලුහුඬුකම් කිහිපයකින් සමන්විත වේ. තවද, මෙම වැටුප් ප්‍රමාණ දර්ශකය, අදාළ පඩිපාලක සභාවලට අදාළ අවම වැටුප් මත පදනම් වේ. කෙසේ වුවද, එම අවම වැටුප්, ආර්ථිකයේ යථාර්තයෙන්ම පවතින වැටුප්වලින් වෙනස් විය හැක. මෙයට හේතු ලෙස ශ්‍රම ඉල්ලුම සහ සැපයුම, අවම වැටුප් සඳහා ඇති නියාමන සහ විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් තල සම්බන්ධව වෘත්තීය සමිති පවත්වන සාකච්ඡා යනාදී විවිධ සාධක දැක්විය හැක. පඩිපාලක සභා වැටුප් ප්‍රමාණ දර්ශකය යාවත්කාලීන කිරීම තුළින් යල්පිනූ පදනම් වර්ෂය සඳහා පිළියම් යෙදුනද එම දර්ශකය අවම වැටුප් මත පදනම් වීම නිසා ඇතිවන අවාසිසහගත තත්ත්වය ඒ තුළින් මගහරවා ගත නොහැක.

ආර්ථික සෞභාග්‍ය ළඟාකර ගැනීමේ දී, මනාලෙස ක්‍රියාකාරී පුද්ගලික අංශය වැදගත් වූ දායකත්වයක් සපයන අතර එම අංශය නිෂ්පාදන සාධක වඩා කාර්යක්ෂම ලෙස භාවිතා කරන බව සැලකේ. මේ නිසා විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන වඩා නියෝජනාත්මක වැටුප් ප්‍රමාණ දර්ශකයක් මගින් නිරීක්ෂණය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, සේවක අර්ථ සාධක අරමුදලේද (සේ.අ.අ.) සහාය ඇතිව ලැස්පියර් මිල දර්ශකය පදනම් කොට ගෙන නව වැටුප් ප්‍රමාණ දර්ශකයක් සැකසීමට දැනටමත් මුල් පියවර ගෙන ඇත. මෙම දර්ශකය සැකසීමේ දී, සේවකයින්ගේ වැටුප් ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදලෙහි දායක මුදලේ ව්‍යවස්ථාපිත ප්‍රතිශතයට සමානුපාත බව උපකල්පනය කෙරේ. මෙම ක්‍රියාවලියේ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන අංශ සඳහා වෙන් වශයෙන් උප දර්ශක සම්පාදනය වනු ඇත. යෝජිත වැටුප් දර්ශකය සම්පාදන කිරීමේ දී දැනට විධිමත් අංශය සඳහා පවතින වැටුප් ප්‍රමාණ දර්ශකයේ දී භාවිතා වන පඩි පාලක සභාවලට අදාළ අවම වැටුප වෙනුවට, සේවකයන් වෙත ගෙවන නියත වැටුප භාවිතා වේ. එම නිසා සාක්ෂි මත පදනම් වන ප්‍රතිපත්ති සැකසුම සඳහා එය විශ්වාසදායී දර්ශකයක් වනු ඇතැයි අනුමාන කළ හැකි අතර, එය විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් පීඩන පිළිබඳවද වඩාත් නියෝජනාත්මක අනුරුවක් සපයයි.

සේ.අ.අ. මගින් ලබාදෙන සමූහ දත්ත ආශ්‍රයෙන් අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා වෙනම වැටුප් ප්‍රමාණ දර්ශකයක් සම්පාදනය කිරීමට ද යෝජනා වී ඇත. විධිමත් පෞද්ගලික අංශය සහ අර්ධ රාජ්‍ය අංශය සඳහා වන යෝජිත වැටුප් ප්‍රමාණ දර්ශක සමග දැනට පවතින රාජ්‍ය සහ අවිධිමත් පෞද්ගලික අංශය සඳහා වන වැටුප් ප්‍රමාණ දර්ශක, ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්ති පරාසයෙහිම වැටුප් ප්‍රවණතා ආවරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එමගින් ආර්ථිකයේ ඉල්ලුම් අංශයේ වර්ධන පිළිබඳ ප්‍රයෝජනවත් දැක්මක්ද සපයනු ඇත.

ඒ අයුරින්, මෙම වැටුප් ප්‍රමාණ දර්ශක සමග කාර්තුමය ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සහ මාසික ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මගින් නිශ්චය කර ගනු ලබන ශ්‍රම වෙළඳපොළ වර්ධන, මුදල් ප්‍රතිපත්ති සැකසීමේ දී ප්‍රමුඛ දර්ශක ලෙස භාවිතා කළ හැක.

ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන් හට, නාමික වැටුප්වල සිදුවන විචලන ඉදිරියේ දී ඇති විය හැකි උද්ධමන පීඩන තත්ත්ව මිනුම්ගත කිරීමේ දී වැදගත් සංඥා සපයනු ලබයි. අනෙකුත් සාධක නියතව පවතින විටෙක, ඉහළ වැටුප් මට්ටම් මගින් ඉහළ වැය කළ හැකි ආදායමක් හඟවයි. වැටුප් ඉහළ යෑම තුළින් සිදුවන ආදායම් මට්ටම්වල ඉහළ යෑම, වඩා වැඩි, ක්‍රමයෙන් වැඩි වන බදු ආදායමකට මග පාදන අතර එමගින් රාජ්‍ය මූල්‍ය හිඟය මත වන පීඩනය අවම කරයි. කෙසේ වුවත්, නාමික වැටුප් වර්ධනය වැඩ කරන ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට ප්‍රමාණවත් නොවිය හැකි අතර මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා මූර්ත වැටුප් ඉහළ යා යුතුය. කෙසේ වෙතත්, මූර්ත වැටුපෙහි දීර්ඝ කාලීන අඩු වීම අනාගතයේ මතු විය හැකි වැටුප් පීඩන සහ ශ්‍රම ඵලදායිතාවයෙහි, පහළ යෑම පිළිබඳ වැදගත් සංඥාවක් ලෙස සැළකිය හැකිය.

---


මූලාශ්‍ර:

ec.europa.eu. (2017). Labour cost index - recent trends - Statistics Explained. [online] Available at: http://ec.europa.eu/eurostat/statistics-

ons.gov.uk. (2017). Index of UK labour costs per hour, experimental- Office for National Statistics. [online] Available at: https://www.ons.gov.uk/employmentandlabourmarket/peopleinwork/earningsandworkinghours/bulletins/indexoflabourcostsperhourilch/julytosept2016#background-notes


4

වඩා තරමක් පහළ මට්ටමකින් පැවතීම හේතුවෙන් රාජ්‍ය සේවකයන්ගේ මූර්ත වැටුප්, 2015 වසරේ සිදුවූ සියයට 27.0 ක සැළකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 0.1 කින් සුළු වශයෙන් පහළ ගියේය.

### පෞද්ගලික අංශයේ වැටුප්

**ජාතික අවම වැටුප සහ අයවැය සහන දීමනාව පිළිබඳව රජය විසින් හඳුන්වා දුන් ප්‍රධාන පනත්, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ යෑමට හේතු විය.** පඩිපාලක සභා විසින් වැටුප් පාලනය කරනු ලබන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2016 වසරේ දී සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2016 වසරේ මධ්‍යස්ථ වශයෙන් ඉහළ ගියේය. වසර තුළ දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකවල සිදු වූ ප්‍රතිශතාත්මක වර්ධනය අවම මට්ටමක පැවතීම හේතුවෙන් විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ ගියේය. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල වර්ධනයක් දක්නට ලැබිණි. ඉදිකිරීම් අංශයෙහි වර්ධනයත් සමග පෙදරේරු සහ වඩු කාර්මික වෘත්තීන්හි ශ්‍රමය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් මෙම වෘත්තීන්හි වැටුප්වල ඉහළ යෑමක් දක්නට ලැබිණි. තවද, අවශ්‍ය ගුණාත්මක භාවයෙන් යුතු ශ්‍රම සැපයුමෙහි පවතින හිඟය හේතුවෙන් පෙදරේරු සහ වඩු කාර්මික වෘත්තීන්හි යෙදෙන සේවකයන්ගේ ඉහළ කේවල් කිරීමේ හැකියාව මෙම වැටුප් ප්‍රවණතා තුළින් අඟවනු ලබයි.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**ආර්ථිකයෙහි දිගුකාලීන ශ්‍රම සැපයුමෙහි ප්‍රධානම සාධකය වන ජනගහන වර්ධනය, පසුගිය වසර 4 ට සාපේක්ෂව සුළු ඉහළ වර්ධනයක් පෙන්නුම් කරමින් 2016 වසරේ දී සියයට 1.1 ක් ලෙස වාර්තා විය.** ඒ අනුව, 2016 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 21.203 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රමුඛතම දායකත්වය ලබාදෙන බස්නාහිර පළාත, මුළු ජනගහනයෙන් සියයට 28.4 කට හිමිකම් කියනු ලැබේ. වයස් ව්‍යුහය අනුව ජනගහනය ගත් විට, වැඩ කළහැකි වයසේ ජනගහනය (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) මුළු ජනගහනයෙන් සියයට 74.8 කින් සමන්විත වේ. කෙසේ වුවද, වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් සියයට 16.5 ක් වැඩිහිටි ජනගහනය (වයස අවුරුදු 60 සහ ඊට වැඩි) වේ. ශ්‍රී ලංකාවේ ජනගහන උපනතිය සැලකූ විට, විශේෂයෙන්ම ජනගහනය වයස්ගත වීමේ සංසිද්ධිය සමග, දිගුකාලීන ශ්‍රම සැපයුම අඩු මට්ටමක පවතින බව මෙම ප්‍රවණතා මගින් පිළිබිඹු කරයි.

**4.7 සංඛ්‍යා සටහන**
**දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| දිස්ත්‍රික්කය | 2015 | | 2016 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය (ඇ) | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය (ඇ) |
| කොළඹ | 2,375 | 3,513 | 2,395 | 3,543 |
| ගම්පහ | 2,354 | 1,755 | 2,372 | 1,769 |
| කළුතර | 1,250 | 793 | 1,261 | 800 |
| මහනුවර | 1,416 | 739 | 1,434 | 748 |
| මාතලේ | 502 | 257 | 508 | 260 |
| නුවරඑළිය | 740 | 434 | 748 | 438 |
| ගාල්ල | 1,091 | 675 | 1,102 | 682 |
| මාතර | 837 | 659 | 845 | 665 |
| හම්බන්තොට | 628 | 252 | 637 | 255 |
| යාපනය | 597 | 643 | 602 | 648 |
| මන්නාරම | 104 | 55 | 106 | 56 |
| වව්නියාව | 179 | 96 | 182 | 98 |
| මුලතිව් | 94 | 39 | 95 | 39 |
| කිලිනොච්චිය | 120 | 100 | 122 | 101 |
| මඩකලපුව | 541 | 207 | 550 | 211 |
| අම්පාර | 677 | 160 | 691 | 164 |
| ත්‍රිකුණාමලය | 397 | 157 | 404 | 160 |
| කුරුණෑගල | 1,658 | 359 | 1,676 | 362 |
| පුත්තලම | 790 | 274 | 801 | 278 |
| අනුරාධපුරය | 893 | 134 | 905 | 136 |
| පොළොන්නරුව | 419 | 136 | 425 | 138 |
| බදුල්ල | 844 | 299 | 854 | 302 |
| මොණරාගල | 472 | 86 | 479 | 87 |
| රත්නපුරය | 1,127 | 348 | 1,140 | 352 |
| කෑගල්ල | 861 | 511 | 869 | 516 |
| **සමස්ත දිවයින** | **20,966** | **334** | **21,203** | **338** |

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.
(ඇ) වර්ග කි.මී.ට පුද්ගලයන්

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ශ්‍රම බලකාය


**ආර්ථිකයේ වර්තමාන ශ්‍රම සැපයුම විදහා දක්වන ප්‍රධාන මිණුම් දණ්ඩක් වන ශ්‍රම බලකාය 2016 වසරේ දී වර්ධනයක් පෙන්නුම් කළද, එය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය.** වයස අවුරුදු 15 ට වැඩි ආර්ථික වශයෙන් සක්‍රීය[5] ජනගහනය ලෙස

5 ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ දී අදාළ කාලය තුළ දී සේවා නියුක්තව හෝ වියුක්තව සිටින/සිටි පුද්ගලයන් අයත් වේ.

4

**4.3 රූප සටහන**

**ශ්‍රම බලකායේ සහ සේවා වියුක්තියේ ප්‍රවණතා (2012-2016)**




සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012 පළමුවන කාර්තුව සඳහා කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පවත්වා නොමැත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



අර්ථ දැක්වෙන ශ්‍රම බලකාය, 2015 වසරේ වාර්තා වූ මිලියන 8.214 සිට 2016 වසරේ මිලියන 8.311 ක් ලෙස සියයට 1.2 කින් වර්ධනය විය. කෙසේ වුවද, ශ්‍රම බලකාය, වයස අවුරුදු 15 ට සහ ඊට වැඩි ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස අර්ථ දැක්වෙන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2015 වසරේ වාර්තා වූ සියයට 53.8 හි ම 2016 වසරේ දී ද නොවෙනස්ව පැවතිණි. මේ සඳහා හේතු වූයේ අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්භ ජනගහනයේ වර්ධනය, ශ්‍රම බලකායේ වර්ධනයට බොහෝ සෙයින් සමාන වූ බැවිණි.

**ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සහභාගිත්ව පරතරය, පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්වයට පක්ෂව තවදුරටත් පැවැතුණි.** ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2016 වසරේ සියයට 35.9 ක් ලෙස වාර්තා වූ අතර පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්වය එම කාලසීමාවේ දී සියයට 75.1 ක් ලෙස වාර්තා විය. මෙයින් පෙන්නුම් කරන්නේ ස්ත්‍රී පක්ෂයේ ශ්‍රම බලකායට සහභාගිවීමට පවත්නා කැමැත්ත පුරුෂ පක්ෂයේ මෙන් අඩකටත් වඩා අඩු මට්ටමක පවතින බවයි. වසර ගණනාවක් පුරාවට ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ දක්නට ලැබුණේ සුළු වර්ධනයක් පමණක් වූ බැවින් සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය වර්තමානයේ දී ද සියයට 54 ක පමණ ස්ථාවර මට්ටමක පවතී. ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ මට්ටමක රැඳීමට හේතු ලෙස, නම්‍යශීලී පැය පදනම මත හෝ නිවසේ සිට රාජකාරී කිරීමට පවතින අවස්ථා අවම වීම, දරුවන් රැකබලාගැනීමේ විධිමත් පහසුකම් අවම මට්ටමක පැවතීම, නිවසේ වගකීම් බහුලව දැරීමට සිදු වීම සහ පොදු ප්‍රවාහන සේවා සම්බන්ධ දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවීම වැනි කරුණු දැක්විය හැක. මෙම ප්‍රවණතාව නොකඩවා පැවතුණහොත්, ආර්ථිකයේ වර්ධනයට අවශ්‍ය වන තරම් ශ්‍රම සැපයුමක් පවත්වාගැනීම අනාගතයේ දී අභියෝගාත්මක වනු ඇත. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය හා රැකියා වියුක්ති අනුපාතිකය හැරුණු කොට ශ්‍රම වෙළඳපොළේ ගුණාත්මක බව මනිනු ලබන දර්ශකයක් ලෙස ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ද භාවිතා වන හෙයින් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තුළින් ශ්‍රම බලකායේ උපරිම උපයෝගිතාව කරා ළඟාවිය යුතු අතර එය සාර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයකට උරදෙනු ඇත. එක් එක් කර්මාන්තවලට ආසන්න ප්‍රදේශවලින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම සමානුපාතිකව බඳවා ගැනීම වැනි ක්‍රියාවන් තුළින් ස්ත්‍රී පක්ෂය ශ්‍රම බලකායට ආකර්ෂණය කර ගත හැකි වනු අතර එය ශ්‍රම බලකා සහභාගිත්වය වර්ධනය කරගැනීමට හේතු වනු ඇත.

**4.8 සංඛ්‍යා සටහන**

**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)(ආ)(ඇ)**

| ශීර්ෂය | 2015 (ඈ) | 2016 | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000 | **15,282** | **15,382** | **15,384** | **15,560** | **15,468** | **15,449** |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | **8,214** | **8,319** | **8,193** | **8,376** | **8,355** | **8,311** |
| සේවා නියුක්ත | 7,831 | 7,969 | 7,815 | 8,000 | 8,007 | 7,948 |
| සේවා වියුක්ත | 383 | 350 | 378 | 376 | 348 | 363 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඉ) | **53.8** | **54.1** | **53.3** | **53.8** | **54.0** | **53.8** |
| පුරුෂ | 74.7 | 75.5 | 74.9 | 75.0 | 74.9 | 75.1 |
| ස්ත්‍රී | 35.9 | 36.3 | 35.1 | 36.1 | 36.0 | 35.9 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජුලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඈ) සංශෝධිත
(ඉ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණවලින් අනාවරණය වන තොරතුරු අනුව, ආර්ථිකයේ ශ්‍රම සැපයුමේ හිඟයක් පෙන්නුම් කෙරේ.** වර්තමානයේ ආයතනවල සිටින සේවක සංඛ්‍යාව, පවත්නා සහ ඉදිරියේ අපේක්ෂිත ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් නොවන බවත්, එම නිසා ආයතන සඳහා නව ශ්‍රමිකයන් බඳවා ගැනීමට ඇති අරමුණ ධනාත්මකව

පැවති බවත් මෙම සමීක්ෂණවලින් අනාවරණය විය. ආර්ථිකයේ පැවැති ශ්‍රම සැපයුම කාලයත් සමග අඩු වී ඇති බවත් සමීක්ෂණවලින් තව දුරටත් හෙළි වන අතර, මේ තුළින් පැහැදිලි වන්නේ අනාගත සේවා නියුක්ති අවශ්‍යතා සඳහා කුසලතා නොගැලපීමට පිළියම් යෙදිය යුතු බවයි.

## සේවා නියුක්තිය

**ආර්ථිකයේ සපුරනු ලැබූ ශ්‍රම ඉල්ලුම සඳහා වන ප්‍රධාන මිණුම් දණ්ඩ වන සේවා නියුක්තිය, 2015 වසරේ වාර්තා වූ මිලියන 7.831 ට සාපේක්ෂව 2016 වසරේ මිලියන 7.948 දක්වා සියයට 1.5 කින් වර්ධනය විය.** මෙම සේවා නියුක්තියේ ඉහළ යෑම, ප්‍රධාන වශයෙන්ම කාර්මික හා සේවා අංශවල සිදු වූ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. කෙසේ වුවද, අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල සිදු වූ පහළ යෑම, සලකා බලන කාල පරිච්ඡේදය තුළ දී එම අංශයේ සේවා නියුක්තිය පහළ යෑමට හේතු විය. ඒ අනුව, මුළු සේවා නියුක්තියෙන් සියයට 27.1 ක් කෘෂිකර්මාන්ත අංශයේ සේවයේ නියුතු වූ අතර, පිළිවෙළින් සියයට 26.4 ක් සහ සියයට 46.5 ක් කර්මාන්ත සහ සේවා යන අංශවල සේවයේ නියුතු විය.

**සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, අනෙක් සියලුම අංශවල සේවා නියුක්තිය පහළ යෑමක් දක්නට ලැබිණි.** මේ අනුව, රාජ්‍ය සේවය, සේවා යෝජකයන්, ස්වයං රැකියාවන්හි නියුතු වූවන් හා ගෙවීමක් නොලබන පවුලේ සේවකයන් යන අංශවල සේවා නියුක්තිය 2016 වසරේ දී පහළ ගියේය. 2016 වසර තුළ දී, සේව්‍ය හා ගෙවීමක්

**4.9 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)(ඇ)(ඈ)**

| අංශය | පුද්ගලයන් '000 | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 (ඉ) | 2016 | | | | | 2015 (ඉ) | 2016 |
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | | |
| **කෘෂිකර්මාන්ත** | **2,245** | **2,275** | **1,962** | **2,169** | **2,210** | **2,154** | **28.7** | **27.1** |
| **කර්මාන්ත** | **2,018** | **2,068** | **2,121** | **2,145** | **2,055** | **2,098** | **25.8** | **26.4** |
| පතල් හා කැණීම් | 61 | 68 | 59 | 70 | 43 | 60 | 0.8 | 0.8 |
| නිෂ්පාදන | 1,408 | 1,424 | 1,450 | 1,440 | 1,369 | 1,421 | 18.0 | 17.9 |
| ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජල එකතු කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (ගොවිතැන් කටයුතු හැර) | 550 | 576 | 613 | 635 | 644 | 617 | 7.0 | 7.8 |
| **සේවා** | **3,568** | **3,626** | **3,732** | **3,686** | **3,741** | **3,696** | **45.6** | **46.5** |
| තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් වාහන හා යතුරු පැදි අලුත්වැඩියා කිරීම | 1,060 | 1,047 | 1,138 | 1,105 | 1,119 | 1,102 | 13.5 | 13.9 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරීම් | 480 | 513 | 540 | 485 | 527 | 516 | 6.1 | 6.5 |
| නවාතැන් හා ආහාර සැපයීම | 203 | 205 | 185 | 208 | 214 | 203 | 2.6 | 2.6 |
| තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කටයුතු | 52 | 46 | 74 | 73 | 53 | 62 | 0.7 | 0.8 |
| මූල්‍ය සහ රක්ෂණ කටයුතු | 145 | 170 | 166 | 157 | 145 | 159 | 1.8 | 2.0 |
| වෘත්තිය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු | 65 | 67 | 52 | 46 | 54 | 55 | 0.8 | 0.7 |
| පරිපාලනමය සහ සහාය සේවා කටයුතු | 120 | 113 | 97 | 97 | 122 | 107 | 1.5 | 1.4 |
| රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය | 600 | 633 | 608 | 581 | 615 | 609 | 7.7 | 7.7 |
| අධ්‍යාපනය | 324 | 340 | 325 | 358 | 353 | 344 | 4.1 | 4.3 |
| මහජන සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු | 137 | 137 | 136 | 151 | 143 | 142 | 1.8 | 1.8 |
| වෙනත් (ඊ) | 382 | 354 | 412 | 425 | 397 | 397 | 4.9 | 5.0 |
| **මුළු සේවා නියුක්තිය** | **7,831** | **7,969** | **7,815** | **8,000** | **8,007** | **7,948** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 95.3 | 95.8 | 95.4 | 95.5 | 95.8 | 95.6 | | |

(අ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ආ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජුලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.
(ඉ) සංශෝධිත
(ඊ) නිවැසියන්ගේ පරිහරණය සඳහා සම්පාදනය කරනු ලබන සේවා යෝජක කටයුතු, දේපල වෙළඳාම් කටයුතු, කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ ජාත්‍යන්තර සංවිධාන කටයුතු ඇතුළත් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4

**4.10 සංඛ්‍යා සටහන**

**රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)(ඇ)**

ප්‍රතිශත

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයන් | පෞද්ගලික අංශයේ සේවකයන් | සේව්‍යයන් | ස්වයං රැකියාවල නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයන් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2015 (ඈ) | 15.1 | 41.0 | 3.1 | 32.3 | 8.4 | 100.0 |
| **2016** | **14.6** | **43.3** | **2.7** | **31.6** | **7.8** | **100.0** |
| පළමු කාර්තුව | 14.7 | 41.9 | 2.9 | 32.5 | 7.9 | 100.0 |
| දෙවන කාර්තුව | 15.1 | 42.6 | 2.9 | 31.6 | 7.8 | 100.0 |
| තෙවන කාර්තුව | 14.5 | 44.8 | 2.3 | 30.5 | 7.8 | 100.0 |
| සිව්වන කාර්තුව | 14.0 | 43.6 | 2.8 | 31.8 | 7.8 | 100.0 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඈ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



නොලබන පවුලේ සේවකයන් යන අංශවල 2015 වසරට සාපේක්ෂව පිළිවෙළින් සියයට 10.6 ක හා 5.6 ක සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, සමස්ත සේවා නියුක්තිය කෙරෙහි මෙමගින් ඇති වන බලපෑම මධ්‍යස්ථ මට්ටමකට පමණක් සිදු වූයේ සමස්ත සේවා නියුක්තියෙන් සියයට 43.3 ක් නියෝජනය වන පෞද්ගලික අංශයෙහි සිදු වූ සියයට 7.0 ක වර්ධනය හේතුවෙනි.

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව, 2016 වසර අවසානයේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1,398,742 ක් විය.** මෙම සමීක්ෂණයට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු (ශ්‍රී ලංකා පොලීසිය, ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු), දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා නියුක්තිකයන් ඇතුළත් වේ. මේ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2016 නොවැම්බර් මාසයේ දී රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයක් පවත්වන ලදී. එය 1980 සිට පවත්වන ලද 08 වැනි රාජ්‍ය අංශ සේවා නියුක්ති සංගණනය විය. මෙම සංගණනයට මධ්‍යම රජය හා පළාත් සභාවලට අයත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම අර්ධ රාජ්‍ය අංශයේ සියලුම ආයතනද ඇතුළත් විය. 2016 සංගණනයේ මූලික ප්‍රතිඵල අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 874,395 ක් ලෙස වාර්තා වූ අතර එය අර්ධ රාජ්‍ය අංශයේ 243,413 ක් ලෙස වාර්තා විය. මේ අනුව සමස්ත රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2016 වසරේ දී 1,117,808 ක් වේ. මෙම සංගණනයට ත්‍රිවිධ හමුදාවේ සේවා කාර්ය මණ්ඩලය හා අර්ධ රාජ්‍ය ආයතනවලට අනුබද්ධිත සමාගම්වල සේවා නියුක්තිකයන් ඇතුළත් නොවේ. මෙම සංගණනයෙන් පෙන්නුම් කරන පරිදි, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2006 වසරේ සිට 2016 වසර දක්වා සියයට 30 කින් වර්ධනය වී ඇත.

**4.11 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2014 | 2015 (අ) | 2016 (ආ) | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | 2015/ 2014 (අ) | 2016/ 2015 (ආ) |
| රාජ්‍ය (ඇ) | 1,109,186 | 1,136,656 | 1,157,531 | 2.5 | 1.8 |
| අර්ධ රාජ්‍ය (ඈ) | 235,907 | 238,474 | 241,211 | 1.1 | 1.1 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,345,093** | **1,375,130** | **1,398,742** | **2.2** | **1.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සේවා වියුක්තිය

**සේවා වියුක්ති අනුපාතිකය 2015 වසරේ දී වාර්තා වූ සියයට 4.7 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 4.4 දක්වා පහළ ගියේය.** 2015 වසර හා සසඳන විට 2016 වසර තුළ දී ආර්ථිකයේ සේවා නියුක්ති අවස්ථාවල සිදු වූ වර්ධනය පිළිබිඹු කරමින් සමස්ත ශ්‍රම බලකාය සියයට 1.2 කින් වර්ධනය වූ අතර සේවා වියුක්ති පුද්ගල සංඛ්‍යාවෙහි සියයට 5.4 ක අඩුවීමක් වාර්තා විය. මේ අනුව, ස්ත්‍රී හා පුරුෂ ශ්‍රම වියුක්ත පුද්ගල සංඛ්‍යාව 2016 වසරේ පිළිවෙළින් 153,990 ක් හා 212,923 ක් ලෙස වාර්තා විය. 2015 වසරේ සියයට 7.6 ක් ව පැවැති ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2016 වසරේ දී සියයට 7.0 දක්වා පහළ යෑම සහ 2015 වසරේ සියයට 3.0 ක් ව පැවැති පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 2016 වසරේ දී සියයට 2.9 දක්වා පහළ යෑම සමස්ත සේවා වියුක්ති අනුපාතිකයේ පහළ යෑමට හේතු විය.

**අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය සලකා බලන කල සියලුම අධ්‍යාපන මට්ටම්වල සේවා වියුක්ති අනුපාතික පහළ ගියේය.** අ.පො.ස.(උ.පෙළ) හා ඉහළ, අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම් සහ 6-10 ශ්‍රේණි සමත් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික 2015

**4.12 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (අ)(ආ)(ඇ)**

| ශීර්ෂය | 2015 (ඇ) | 2016 | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **සමස්ත** | **4.7** | **4.2** | **4.6** | **4.5** | **4.2** | **4.4** |
| **ස්ත්‍රී පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 3.0 | 3.1 | 3.1 | 2.7 | 2.7 | 2.9 |
| ස්ත්‍රී | 7.6 | 6.1 | 7.3 | 7.6 | 6.8 | 7.0 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | | | | | | |
| 5 ශ්‍රේණිය සමත් සහ ඊට පහළ | ... | ... | ... | ... | ... | ... |
| 6-10 ශ්‍රේණිය | 3.4 | 3.3 | 3.5 | 3.1 | 3.2 | 3.3 |
| අ.පො.ස. (සා.පෙ.) | 6.4 | 5.5 | 6.2 | 5.8 | 5.9 | 5.9 |
| අ.පො.ස. (උ.පෙ.) සහ ඊට ඉහළ | 9.2 | 7.7 | 8.6 | 9.3 | 7.6 | 8.3 |
| **වයස් කාණ්ඩ අනුව** | | | | | | |
| 15-19 | 24.1 | 26.9 | 25.3 | 27.1 | 29.1 | 27.1 |
| 20-24 | 19.7 | 19.7 | 21.2 | 19.8 | 19.0 | 19.9 |
| 25-29 | 9.4 | 9.4 | 8.3 | 9.7 | 9.6 | 9.2 |
| 30-39 | 3.1 | 2.3 | 2.6 | 2.8 | 2.1 | 2.4 |
| 40 සහ ඊට ඉහළ | 1.0 | 0.7 | 1.0 | 0.8 | 0.7 | 0.8 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජුලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වසරේ වාර්තා වූ පිළිවෙළින් සියයට 9.2, සියයට 6.4 සහ සියයට 3.4 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 8.3, සියයට 5.9 සහ සියයට 3.3 දක්වා පහළ ගියේය. අ.පො.ස.(උ.පෙළ) සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත කාණ්ඩයෙන් ඉහළම සේවා වියුක්ති අනුපාතිකයක් වාර්තා වූ අතර එය ආර්ථිකයේ ශ්‍රම ඉල්ලුම සපුරාලීම සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධනය ඉලක්ක කරගත් ක්‍රමවේද නිර්මාණය විය යුතු බවට ඉඟි කරයි.

**වයස් කාණ්ඩ අනුව සැලකූ විට, තරුණ වයස් කාණ්ඩය (වයස අවුරුදු 15-24) හැරුණු කොට අනෙක් සියලුම වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික 2016 වසරේ දී පහළ ගියේය.** තරුණ සේවා වියුක්තිය 2015 වසරේ වාර්තා වූ සියයට 20.8 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 21.6 ක් විය. ඔවුන්ගේ හැකියාවන්ට සුදුසු රැකියාවක් සොයාගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් තරුණ කාණ්ඩ ගුණාත්මක බවින් අඩු රැකියාවල නිරත වීමට හා ඌණ රැකියා නියුක්ති[6] තත්ත්වයට පෙළඹීමට ඉඩ ඇති අතර එය ඔවුන්ට දරිද්‍රතාවයෙන් මිදීමට හා ආර්ථිකයේ සමස්ත වර්ධනයේ කොටස්කරුවන් බවට පත්වීමට ඇති මාර්ග අවහිර කරනු ඇත.

**තරුණ NEET (Not in Employment, Education or Training) අනුපාතය, (රැකියාවක, අධ්‍යාපනයේ හෝ පුහුණු කටයුතුවල නොයෙදෙන) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත 2015 වසරේ ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නව මිනුමකි.** මේ අනුව, සෑම තරුණයන් සිව් දෙනෙකුගෙන් එක් තරුණයෙක් NEET කාණ්ඩයට අයත්වන අතර එය තරුණයන්ගේ අක්‍රීය බව හා ඉදිරියේ දී මුහුණ පෑමට සිදුවිය හැකි අවදානම් තත්ත්වය පැහැදිලි කරවයි. 2015 වසර සඳහා NEET ප්‍රතිශතය සියයට 25.8 ක් ලෙස වාර්තා වූ අතර තරුණ ස්ත්‍රී NEET ප්‍රතිශතය තරුණ පුරුෂ NEET ප්‍රතිශතය මෙන් දෙගුණයකටත් වඩා වැඩි අගයක් ගන්නා ලදී. ආර්ථික තත්ත්වය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය නිපුණතා දියුණු කරගත නොහැකි වීම හේතුවෙන් NEET කාණ්ඩයට අයත් තරුණයන් දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමක රැඳෙමින් සමාජයෙන් කොන්වීමේ අවදානමක් පවතී. මෙය පිළිබඳ ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් නුදුරු අනාගතයේ ආර්ථික හා සමාජීය ගැටලු ඇති විය හැකි අතර ඉහළ NEET අගයන් දිගුකාලීනව ගත් කළ ශ්‍රම බලකායේ නිපුණතා පිරිහීමට ද හේතුකාරක වනු ඇත.

**තරුණ, කාන්තා හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද කාණ්ඩ අතර පවතින ඉහළ සේවා වියුක්තිය ආර්ථිකයේ දිගින් දිගටම පවතින බරපතළ ප්‍රශ්නයක් බවට පත්ව ඇත.** කුසලතා නොගැලපීම, මූල්‍ය පහසුකම් ලබාගැනීමට ඇති අපහසුතාව, රැකියා ඉලක්ක කරගත් පුහුණු පාඨමාලා නොමැති වීම මෙම තත්ත්වයට බලපාන ප්‍රධාන හේතු අතරින් කිහිපයකි. කුසලතා නොගැලපීම දුරු කිරීමට වෘත්තීය පුහුණු පාඨමාලා වැනි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුවද සීමාවාසික හා ආධුනිකත්ව පුහුණු වැඩසටහන් මගින් තවදුරටත් කුසලතා වර්ධන කටයුතු දියුණු කළ හැකිය. මූල්‍ය පහසුකම් ලබාගැනීමට ඇති ගැටලුව විසඳීම සඳහා 2017 අයවැය යෝජනා අනුව තරුණ සහ කාන්තා වැනි හඳුනාගත් කාණ්ඩ සඳහා ණය ලබාදීමට බැංකු උනන්දු කර ඇත. රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් මගින්, ඉදිකිරීම් සහ හෝටල් ක්ෂේත්‍ර වැනි ශීඝ්‍රයෙන් නැගී එන එහෙත් අවශ්‍ය පුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් හිඟයක් පවතින අංශ සඳහා, දේශීය ශ්‍රම බලකාය යොදා ගත හැකි වන අතර පිටරටින් සේවකයින් ගෙන්වා ගැනීමට ඇති අවශ්‍යතාවද අවම වනු ඇත. වර්ධනය වන ආර්ථිකයට සුදුසු විවිධ වූ සේවක අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ හෝ තත්ත්වයෙන් උසස් ලෙස සැලකෙන රැකියා අපේක්ෂා කරන තරුණයින්ගේ ආකල්පද වෙනස් විය යුතුය.

6 1966 ICLS සමුළුවේ පුළුල් ලෙස සාකච්ඡා කරන ලද පරිදි, ඌන රැකියා නියුක්තිය තමාට තරම් නොවන රැකියාවක නියුතු වීම හෝ පුහුණුවට හෝ පළපුරුද්දට සරිලන වැටුපක් සහිත රැකියාවක් නොමැති වීම හේතුවෙන් හටගනී. ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2015 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4

## විදේශ සේවා නියුක්තිය

**2016 වසර තුළ දී 2015 වසරට සාපේක්ෂව විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගේ සියයට 7.8 ක පහළ යෑමක් වාර්තා විය.** විදේශ සේවා නියුක්තියේ අඛණ්ඩ පහළ යෑම කෙරෙහි රජය මගින් ගෘහ සේවිකා පිටත්ව යෑම් අවම කිරීමට ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, පිටත්ව යෑමට පෙර සපුරාලිය යුතු පුහුණු අවශ්‍යතා සහ ප්‍රධාන විගමනික ගමනාන්තයක් වන මැද පෙරදිග ආර්ථික කටයුතුවල පසුබෑම හේතුවෙන් ශ්‍රම ඉල්ලුම පහළ යෑම වැනි කරුණු හේතු වී ඇත. මේ අනුව, විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව 2015 වසරේ වාර්තා වූ 263,443 ට සාපේක්ෂව 2016 වසරේ දී 242,930 දක්වා පහළ ගියේය. මෙම සමස්ත පහළ යෑම කෙරෙහි ස්ත්‍රී කාණ්ඩයේ පිටත්ව යෑම් 2015 වසරේ වාර්තා වූ 90,655 සිට 2016 වසරේ 82,628 දක්වා සියයට 8.9 කින් පහළ යෑම මෙන්ම පුරුෂ කාණ්ඩයේ පිටත්ව යෑම් 2015 වසරේ වාර්තා වූ 172,788 සිට 2016 වසරේ 160,302 දක්වා සියයට 7.2 කින් පහළ යෑම ද හේතු විය.

**පසුගිය දශකය තුළ විදේශ සේවය සඳහා පිටත්ව යෑම් බලපත්‍රලාභී නියෝජිතයන් හරහා ගෘහ සේවිකා කාණ්ඩය කේන්ද්‍ර කරගත් පිටත්ව යෑම්වල සිට පෞද්ගලික ක්‍රම හරහා පුරුෂයන් කේන්ද්‍රකරගත් පිටත්ව යෑම් දක්වා පරිවර්තනය වී ඇත.** විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගේ ශ්‍රම කාණ්ඩ අනුව සලකා බැලීමේ දී වෘත්තීය හා මධ්‍යම කාණ්ඩ යන අංශවල සමස්ත වර්ධනය සියයට 12.2 ක් ලෙස වාර්තා වූ අතර අනෙක් සියලුම ශ්‍රම කාණ්ඩවල පිටත්ව යෑම්වල පහළ යෑමක් 2016 වසරේ දී වාර්තා විය. බලධාරීන් විසින් "ආරක්ෂිත, පුහුණු ශ්‍රමික පිටත්ව යෑම්" යන උපායමාර්ගික දිශාව උදෙසා වසර 2008 හි සිට ගත් ක්‍රියාමාර්ග තුළින් විදේශ සේවා පිටත්ව යෑම්වල නිපුණතා මට්ටම්වල ප්‍රගතියක් සිදු වී තිබුණ ද, නුපුහුණු හා ගෘහ සේවිකා කාණ්ඩ තවදුරටත් මුළු පිටත්ව යෑම්වලින් සියයට 56 ක් ලෙස වාර්තා විය. වෘත්තීය කාණ්ඩයේ පිටත්ව යෑම් මුළු පිටත්ව යෑම්වල ප්‍රතිශතයක් ලෙස ගත් කළ 2015 වසරේ වාර්තා වූ සියයට 2.4 සිට 2016 වසරේ දී සියයට 2.7 දක්වා සුළු වර්ධනයක් වාර්තා කළේය. තවද, දකුණු කොරියාවට රැකියා සඳහා පිටත්ව යෑම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළද එයින් සියයට 97 ක් නුපුහුණු ශ්‍රමික කාණ්ඩයට අයත් වේ. මෙම වර්ධනයන් තුළින් පෙන්නුම් කරන පරිදි ආරක්ෂිත පුහුණු ශ්‍රමික පිටත්ව යෑම් දිරිමත් කිරීමේ ක්‍රියාමාර්ග සඳහා තවදුරටත් අවකාශ පවතී. ගෘහ සේවිකා හා නුපුහුණු ශ්‍රම කාණ්ඩවල සිදුවන අඩුවීමට සමානුපාතිකව පුහුණු කාණ්ඩ යටතේ පිටත්ව යෑම් වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම මගින් අඩුවන ප්‍රේෂණ මට්ටම්ද වැඩි දියුණු වනු ඇත.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, 2017 අයවැය මගින් යෝජනා කළ පරිදි නුපුහුණු ශ්‍රමිකයන්ගේ අවම වැටුප අනෙකුත් දීමනා හැර ඇ.එ.ජ. ඩොලර් 350 ක් ලෙස ද පුහුණු ශ්‍රමිකයන්ගේ අවම වැටුප ඇ.එ.ජ. ඩොලර් 450 ක් ලෙසද 2017 පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කරන ලදී.** විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2016 මාර්තු 23 වැනි දින නියම කරන ලද ඇ.එ.ජ. ඩොලර් 300 ක අවම වැටුපට පසුව මෙම නව වැටුප් තල නියම විය. එම නව චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණු වනුයේ ඉහළ නිපුණතා සහිත ශ්‍රමිකයන්ගේ පිටත්වීම් දිරිගැන්වීම සහ විදේශ සේවයේ නියුතු අයගේ සුභ සාධනය ශක්තිමත්

**4.13 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2014 | | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % |
| මුළු විදේශ රැකියා සංඛ්‍යාව | **300,703** | **100.0** | **263,443** | **100.0** | **242,930** | **100.0** |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 176,829 | 58.8 | 116,749 | 44.3 | 88,164 | 36.3 |
| වෙනත් | 123,874 | 41.2 | 146,694 | 55.7 | 154,766 | 63.7 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 190,217 | 63.3 | 172,788 | 65.6 | 160,302 | 66.0 |
| ස්ත්‍රී | 110,486 | 36.7 | 90,655 | 34.4 | 82,628 | 34.0 |
| ශ්‍රම කාණ්ඩය අනුව | | | | | | |
| වෘත්තීය | 5,372 | 1.8 | 6,251 | 2.4 | 6,574 | 2.7 |
| මධ්‍යම | 20,778 | 6.9 | 6,951 | 2.6 | 8,235 | 3.4 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 29,267 | 9.7 | 12,501 | 4.7 | 10,864 | 4.5 |
| පුහුණු ශ්‍රමික | 73,162 | 24.3 | 81,682 | 31.0 | 76,559 | 31.5 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3,977 | 1.3 | 4,847 | 1.8 | 3,930 | 1.6 |
| නුපුහුණු ශ්‍රමික | 79,519 | 26.4 | 77,985 | 29.6 | 71,641 | 29.5 |
| ගෘහ සේවිකා | 88,628 | 29.5 | 73,226 | 27.8 | 65,127 | 26.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**4.14 සංඛ්‍යා සටහන**

**ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2015 (අ) | | 2016 (ආ) | | වෙනස (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබිය | 74,894 | 28.4 | 63,389 | 26.1 | -11,505 | -15.4 |
| කටාර් | 65,139 | 24.7 | 59,527 | 24.5 | -5,612 | -8.6 |
| කුවේට් | 38,473 | 14.6 | 32,415 | 13.3 | -6,058 | -15.7 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 43,666 | 16.6 | 40,124 | 16.5 | -3,542 | -8.1 |
| වෙනත් | 41,271 | 15.7 | 47,475 | 19.5 | 6,204 | 15.0 |
| **එකතුව** | **263,443** | **100.0** | **242,930** | **100.0** | **-20,513** | **-7.8** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

කිරීමයි. කෙසේ වුවද, මෙසේ අවම වැටුපක් නියම කිරීම තුළින් ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමික මිල ඉහළ යන අතර එය අන්තර්ජාතික ශ්‍රම වෙළඳපොළේ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ තරගකාරිත්වය අඩු කිරීමට හේතු වනු ඇත. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකාව විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගයන්ගෙන් එකක් වන අතර එහි සිදුවන පසුබෑම් විදේශීය අංශයේ ජංගම ගිණුම් ශේෂයට අහිතකර බලපෑමක් එල්ල කරනු ඇත.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රම සංක්‍රමණික ක්‍රියාවලිය නියාමනය කිරීමට මෙන්ම ඔවුන්ගේ අභිමානය, සුරක්ෂිතභාවය හා ඔවුන් කෙරෙහි සාධාරණත්වය තහවුරු කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.** වෙබ් අඩවි පදනම් කොට ගත් බඳවා ගැනීමේ පද්ධතිය (Web-based Recruitment System) වැඩි රටවල් ප්‍රමාණයක් ආවරණය වන පරිදි පුළුල් කෙරුණු අතර එමගින් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන්ට විශ්වාසවන්ත රැකියා අවස්ථා සහතික කිරීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2016 වසරේ දී විදේශ රැකියා සඳහා නීති විරෝධී ලෙස බඳවාගැනීම් සම්බන්ධ වැටලීම් 201 ක් සිදු කරන ලදී. මෙය 2015 වසරේ වාර්තා වූ වැටලීම්වලට සාපේක්ෂව සියයට 81 ක ඉහළ යෑමකි. තවද, මිනිස් ජාවාරම් කටයුතුවලට එරෙහි වීම ප්‍රමුඛ කොටගෙන කාර්යාංශය මගින් "මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය" 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී.

## කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

**2016 වසරේ දී කම්කරු සබඳතාවල පිරිහීමක් පෙන්නුම් කරමින් වැඩ වර්ජන සඳහා සහභාගි වූ සමස්ත සේවක සංඛ්‍යාව සහ එම වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන ඉහළ ගිය අතර, එනමුත් වාර්තා වූ සමස්ත වැඩ වර්ජන සංඛ්‍යාව පහළ ගියේය.** ප්‍රධාන වශයෙන්ම වැවිලි නොවන අංශයේ වැඩ වර්ජන සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාවේ වැඩි වීම හේතුවෙන් වැඩ වර්ජන සඳහා සහභාගී වූ සේවක සංඛ්‍යාව 2016 වසරේ දී 20,652 ක් දක්වා සියයට 38.5 කින් ඉහළ ගියේය. වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන, වැවිලි අංශයේ 85,637 දක්වා සියයට 21 කින් ඉහළ ගිය අතර වැවිලි නොවන අංශයේ එය 18,690 දක්වා සියයට 61 කින් ඉහළ ගියේය. වැවිලි අංශයේ පවතින සේවක ගැටලු සහ එහි පවතින අඩු ඵලදායිතා තත්ත්වයද මුල්කොට ගෙන එම අංශය අඩු

**4.15 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2013 | 21 | 5,031 | 41,669 | 21 | 6,088 | 38,754 | 42 | 11,119 | 80,423 |
| 2014 | 31 | 4,833 | 29,165 | 7 | 1,618 | 8,158 | 38 | 6,451 | 37,323 |
| **2015** | **31** | **10,427** | **70,697** | **20** | **4,488** | **11,597** | **51** | **14,915** | **82,294** |
| පළමු කාර්තුව | 10 | 1,972 | 10,291 | 6 | 391 | 2,415 | 16 | 2,363 | 12,706 |
| දෙවන කාර්තුව | 1 | 1,369 | 10,952 | 5 | 1,525 | 2,600 | 6 | 2,894 | 13,552 |
| තෙවන කාර්තුව | 19 | 6,771 | 47,564 | 5 | 374 | 2,332 | 24 | 7,145 | 49,896 |
| සිව්වන කාර්තුව | 1 | 315 | 1,890 | 4 | 2,198 | 4,250 | 5 | 2,513 | 6,140 |
| **2016 (ආ)** | **26** | **10,485** | **85,637** | **15** | **10,167** | **18,690** | **41** | **20,652** | **104,327** |
| පළමු කාර්තුව | 11 | 3,876 | 26,083 | 2 | 4,350 | 8,700 | 13 | 8,226 | 34,783 |
| දෙවන කාර්තුව | 6 | 2,380 | 14,661 | 8 | 3,022 | 5,775 | 14 | 5,402 | 20,436 |
| තෙවන කාර්තුව | 3 | 533 | 2,877 | 4 | 2,773 | 4,193 | 7 | 3,306 | 7,070 |
| සිව්වන කාර්තුව | 6 | 3,696 | 42,016 | 1 | 22 | 22 | 7 | 3,718 | 42,038 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

වර්ධන මට්ටමක් පෙන්නුම් කරයි. අයහපත් කාලගුණික තත්ත්ව මෙන්ම පිරිවැය ඉහළ යෑම වැවිලි අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අයහපත් ලෙස බලපානු ලැබේ.

**සේවා ස්ථාන සහයෝගිතාව හා කාර්මික සමගිය වර්ධනය කිරීම උදෙසා 2016 වසරේ දී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් වඩා යහපත් සේවා පරිසරයක් පෞද්ගලික අංශයේ ඇති කිරීම උදෙසා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, සේවා ස්ථානයේ කාර්මික සමගිය ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමේ සමාජ සංවාදය අරමුණු කොටගෙන තෝරාගත් ආයතනවල කළමනාකරුවන්, ප්‍රධාන කාර්යමණ්ඩල සාමාජිකයන් සහ සේවකයන් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. තවද, වැවිලි අංශයේ අවම වැටුප රු.730 ක් දක්වා ඉහළ නැංවෙන පරිදි සාමූහික ගිවිසුමකට 2016 වසරේ දී අත්සන් තබන ලදී. අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් දෙකක් 2016 වසරේ දී සම්මත කරන ලදී. පළමු සම්මුතියෙන් ශ්‍රී ලංකාව තුළ පූර්ණ, ඵලදායී, ස්වාධීනව තෝරාගත හැකි රැකියා අවස්ථා ඇති කිරීම හා තරුණ රැකියා නියුක්තිය, නිපුණතා වර්ධනය හා ආර්ථික වර්ධනය තුළින් දේශීය සවිබල ගැන්වීමක් ඇති කිරීම වෙනුවෙන් සක්‍රීය රැකියා ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සිදුවේ. තවද, එමගින් ශ්‍රම සුපරීක්ෂාව, ළමා ශ්‍රමය හා ශ්‍රම සංක්‍රමණය සම්බන්ධ කටයුතු වඩා ශක්තිමත් කෙරේ. ශ්‍රී ලාංකික නාවිකයන්ගේ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට මෙන්ම නාවිකයන්ගේ යහපත, සෞඛ්‍ය හා සුරක්ෂිතභාවයට අදාළ වෙළඳ නාවික කර්මාන්තයේ පවතින ප්‍රතිලාභ ලබාගැනීම හා එම ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා වන සම්මුතිය දෙවනුව සම්මත කරන ලදී. තවද, පෞද්ගලික අංශයේ ව්‍යාපාරවලට අදාළව පරිපාලන ලිහිල් කිරීමක් ලෙස 2016 ජනවාරි මස 01 වැනි දින සිට ආරම්භ වන වර්ෂය සඳහා සතියේ දින පහ පමණක් රාජකාරී වේලාව ලෙස සැලකීමට කටයුතු සලසන ලදී.

### ශ්‍රම ඵලදායිතාව

**වැඩ කරන ලද පැයකට එකතු කළ අගය වශයෙන් (2010 මිල මත පදනම්ව) මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2015 පළමු කාර්තු තුන තුළ වාර්තා වූ රුපියල් 462.09 සිට 2016 වසරේ පළමු කාර්තු තුන අවසානයේ දී රුපියල් 463.20 ක් දක්වා සියයට 0.2 ක සුළු වර්ධනයක් 2016 පළමු කාර්තු තුන තුළ දී පෙන්නුම් කළේය.** ආර්ථිකයේ සියලුම අංශ සලකා බලන කල, කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඵලදායිතාව 2016 පළමු කාර්තු තුන සඳහා වැඩ කළ පැයකට රුපියල් 173.70 ක් ලෙස අවම අගයක පවතී. කාර්මික හා සේවා අංශයේ ශ්‍රම ඵලදායිතාව එම කාලසීමාවේ දී පිළිවෙළින් රුපියල් 503.27 ක් හා රුපියල් 561.41 ක් ලෙස වාර්තා විය. කෘෂිකාර්මික අංශය දළ ජාතික නිෂ්පාදිතයට සියයට 7 ක පමණ දායකත්වයක් දරන අතර සේවා නියුක්තියෙන් දළ වශයෙන් සියයට 27 ක් පමණ එම අංශය තුළ සේවයේ නිරත වේ. කෘෂිකාර්මික අංශයේ පවතින මෙම අඩු ඵලදායිතාව කෙරෙහි විවිධ සාධක බලපාන අතර සාම්ප්‍රදායික වගා ක්‍රම, ණය පහසුකම් හා නවීන තාක්ෂණික ක්‍රම කෙරෙහි ප්‍රවේශය අපහසු වීම, කුඩා ඉඩම් ප්‍රමාණ, අයහපත් කාලගුණික තත්ත්ව එම සාධක අතුරින් කිහිපයකි. කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව වැඩි දියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග ලෙස වාණිජ කෘෂිකාර්මික කටයුතු සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම, ඉහළ ඵලදාවක් සහිත සහ දෙමුහුම් බීජ වර්ග භාවිතා කිරීම ගෙනහැර දැක්විය හැක. මෙවැනි පියවර තුළින් කෘෂිකාර්මික අගය දාමය ඔස්සේ ඵලදායිතාව වර්ධනය කළ හැකිය. ඒ මගින් එම අංශය මත යැපෙන ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවිය හැකි වන අතරම එය ආර්ථිකයේ සෞභාග්‍ය ළඟාකර ගැනීමට ද ඉවහල් වනු ඇත.

**සමස්ත ආර්ථිකයේ වර්ධනය උදෙසා කර්මාන්ත හා සේවා අංශයේ ඵලදායිතාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකියාවක් පවතී.** එය එම අංශවල දැනටමත් සේවයේ නියුතුවන සේවකයන්ගේ ඵලදායිතා මට්ටම වැඩි දියුණු කිරීමට ගන්නා ක්‍රියාමාර්ග තුළින් මෙන්ම සේවා වියුක්ත පුද්ගලයන්ගේ ප්‍රයෝජනයට නොගත් කුසලතා පාදාගැනීමට ගන්නා ක්‍රියාමාර්ග තුළින් ද සිදු කළ හැක. කර්මාන්ත හා සේවා අංශය සලකා බලන කල, තරුණ හා අධ්‍යාපනික සුදුසුකම් සහිත කාණ්ඩ මෙමෙ අංශවල සේවා නියුක්තවීමට වැඩි වශයෙන්

**4.16 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව**

| | 2015 (පළමු කාර්තු තුන) | 2015 (ඇ) | 2016 (පළමු කාර්තු තුන) (ආ) |
|---|---|---|---|
| ස්ථාවර (2010) මිල අනුව දළ එකතු කළ අගය (රුපියල් මිලියන) | **5,788,916** | **7,818,224** | **6,019,368** |
| කෘෂිකර්මාන්ත | 492,389 | 670,106 | 479,119 |
| කර්මාන්ත | 1,691,830 | 2,264,673 | 1,790,468 |
| සේවා | 3,604,698 | 4,883,444 | 3,749,781 |
| ශ්‍රම ඵලදායිතාව, වැඩ කරන ලද පැයක් සඳහා රුපියල් | **462.09** | **465.15** | **463.20** |
| කෘෂිකර්මාන්ත | 163.38 | 168.40 | 173.70 |
| කර්මාන්ත | 518.05 | 520.46 | 503.27 |
| සේවා | 576.91 | 576.07 | 561.41 |

(ඇ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අවස්ථා සොයයි. කෙසේ වුවද, කුසලතා නොගැලපීම මගින් ඇති වන ශ්‍රම ඉල්ලුම හා සැපයුමේ නොගැලපීම් හේතුවෙන් මෙම අංශවල වර්ධනයට අවැසි ශ්‍රමයේ හිඟයක් ඇත. නිසි නිපුණතා ගැළපුම් වැඩසටහන් මගින් රැකියා විරහිත ජනගහනය ඵලදායී ලෙස ආර්ථික ක්‍රියාවලීන් තුළට සහභාගි කරවා ගත යුතුය. දැනටමත් සේවයේ නියුක්ත වූවන්ගේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම උදෙසා අඛණ්ඩ සංවර්ධන වැඩසටහන් යොදාගත හැකි අතර මේ තුළින් කර්මාන්ත හා සේවා අංශවල ව්‍යාපාර කටයුතුවල අනාගත තරඟකාරිත්වය තහවුරු වනු ඇත. වයස්ගත පුද්ගලයන් ශ්‍රමිකයන් ලෙස සහභාගි වීමෙන් පැනනැගිය හැකි ඵලදායිතාව සම්බන්ධ ගැටලුද ඒ තුළින් මගහරවාගත හැකි වනු ඇත. තවද, කර්මාන්ත හා සේවා අංශවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ද නවීන තාක්ෂණික ක්‍රම යොදාගත හැකිය. කෙසේ වුවද, තාක්ෂණික ක්‍රම යොදා ගැනීම සමස්ත ව්‍යාපාරයම පුළුල් ලෙස ආවරණ වන පරිදි සිදු විය යුතු අතර සෑම සේවකයෙකු මෙන්ම සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන් නවීන තාක්ෂණයට අනුගත විය යුතුය. එමගින් ව්‍යාපාරවල නවීන තාක්ෂණික ක්‍රම යොදා ගැනීමේ උපායමාර්ගික දිශාව සාර්ථක වනු ඇත. තවද, ශීඝ්‍රයෙන් සිදුවන තාක්ෂණික වෙනස්වීම් හේතුවෙන් යම් රැකියා යල්පිනූ ස්වභාවයක් ගන්නා බැවින් වෙනස් වන ශ්‍රම ඉල්ලුම් ප්‍රවණතා සඳහා ශ්‍රමිකයන්ගේ නිපුණතා මට්ටම්ද යාවත්කාලීන කරගත යුතු වනු ඇත.

4

4